රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව

**2023 පෙබරවාරි මස මහා සභා රැස්වීම.**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ **2023.02.16** දින පෙ.ව **10.00** ට පමණ රුවන්වැල්ල ප්‍රාදේශීය සභා රැස්වීම් ශාලාවේ පවත්වන්නට යෙදුනු ගරු මහා සභාවේ රැස්වීම් වාර්තාවයි.

පැමිණීම.

1. ගරු සභාපති - එච්.සමන් කුලසූරිය මහතා
2. ගරු උප සභාපති - කේ.පී. රත්නපාල පීරිස් මහතා
3. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී - ටී.එම්. ෂිහාම් මහතා
4. ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී - ආර්.පී. සිරිපාල රත්නායක මහතා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ.එස්. ආනන්ද පෙරේරා මහතා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.එන්.ඒ.ආර්.හතරසිංහ මහතා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.ආර්. උපාලි විජේරත්න මහතා
8. ගරුප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ.සී.ඒ. අධිකාරි මහතා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ. චන්ද්‍රපාල වේරගොඩ මහතා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ඩී.කේ.යූ. විපුලාවතී හාමිනේ මහත්මිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.ඒ.සී පුෂ්ප කාන්ති මහත්මිය
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.විජය කුමාර් මහතා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - කේ.ඩබ්.ඒ.එල්.ඩී. වික්‍රමආරච්චි මහත්මිය
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - කේ.ඩී.එන්. සුරංගනී මහත්මිය
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ජී.එන්.පී. ජයතිලක මහතා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.එච්.එම්.පී.ඩී.වෛද්‍යරත්න මහතා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩී.ඒ.බී.කේ.කරුණාරත්න මහතා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පි.ඒ සරත් මහතා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ටී.සී. සම්පත් දිසානායක මහතා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ. නිශාන්ත ප්‍රදීප් කරුණාරත්න මහතා
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ජී.එල්. නිශ්ශංක මහතා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - ආර්.වත්සලා මධුෂානි රන්වලගේ මහත්මිය
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.ඒ.එස්.පී. ජයසූරිය මහතා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.ආර්. මංජුල නවරත්න මහතා
25. .ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනී - එච්.ඒ.නාලනී සුමිත්‍රා හෙට්ටි ආරච්චි මහත්මිය
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.රාමචන්ද්‍ර මහතා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි - එම්.එන්.එෆ් සානාස් මහත්මිය
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.නයනජිත් පුෂ්ප කුමාර මහතා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

නොපැමිණීම

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.පී. සුදත් ආනන්ද මහතා

ආගම සිහි කිරීම

පළමුව ආගම සිහි කිරීමෙන් පසුව මහා සභාවට පැමිණි සියළු දෙනාම ගරු සභාපතිතුමා සාදරයෙන් පිළිගන්නා බව පවසමින් මහා සභාවේ කටයුතු ආරම්භ කරන ලදි.

රණවිරුවන් සිහි කිරීම

ගරු සභාපතිතුමා ඇතුළු මන්ත්‍රී මණ්ඩලය විනාඩියක නිශ්ශබ්දතාවයක් ගත කරමින් රණවිරුවන් සිහි කරන ලදි.

අ.පසුගිය සභා වාරයේ සභා වාර්තාව සභා සම්මත කිරීම.

**2023.01.12** දිනැති මාසික මහා සභා රැස්වීම් වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා/තුමියන්ලා වෙත එවා ඇති බවත්, එය කියවුවා සේ සලකා ඒ සම්බන්ධව යම් සංශෝධනයන් වේ නම් ඉදිරිපත් කරන ලෙසත් දැනුවත් කරන ලදි.

කිසිදු සංශෝධනයක් ඉදිරිපත් නොවූ බැවින්, පසුගිය සභා වාර්තාව සභා සම්මත කිරිමට කටයුතු කරන ලෙස ගරු සභාපතිතුමා පවසන ලදි.

2023.01.12 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා විසින් යෝජනා කරන ලදි. ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා විසින් එම යෝජනාව ස්ථිර කරන ලද අතර, 2023.01.12 දිනැති ගරු මහා සභා රැස්වීම් වාර්තාව සංශෝධන රහිතව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ආ.<u>ගරු සභාපතිතුමාගේ නිවේදන වාරය</u>

1. රුවන්වැල්ල ප්‍රාදේශීය සභා සේවක සුභ සාධක සංගමය විසින් සුභ සාධක සංගමේ අරමුදල තර කර ගැනීමේ අරමුණින් පවත්වන්නට කටයුතු සංවිධානය කරමින් පවතින සංගීත ප්‍රසංගය පිළිබඳව දැනුවත් කරන්න තිබෙනවා. සුභ සාධක සංගමය විසින් එවා ඇති ලිපිය මම මේ අවස්ථාවේ සභා ගත කරනවා. මන්ත්‍රී මණ්ඩලයේ සියළු දෙනාගේ සහයෝගය ඒ සඳහා ලබා දෙන ලෙස ඉල්ලා සිටිනවා.

2. 2023 ජනවාරි මස අභ්‍යන්තර විගණන වාර්තාව සභා ගත කරනවා.

3. 2023.02.16 දිනැති න්‍යාය පත්‍රයේ ඉ -9 යෝජනාවේ රු. 2,327,175.00 ක් යන්න රු. 2,327,975.00 ක් විය යුතුය.

ඇ.<u>ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ,පෙත්සම් සභාවට ඉදිරිපත් කිරීම.</u>

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.නයනජිත් පුෂ්පකුමාර මහතා විසින්, 2023 අයවැය යෝජනා සම්බන්ධයෙන් ලෙවන්ගම කොට්ඨාශයට අදාලව යෝජනා 3 ක් ඉදිරිපත් කරන ලදී.

1. “පහලගම ඕවල් දෙනිය යාය යාබද මාර්ගය " සංවර්ධනය කිරීම.
2. “ පහලගම පැරණි කොටළුගොඩ කන්ද මාර්ගය ” සංවර්ධනය කිරීම.
3. “ ඉහල පොලොං දෙනිය මාර්ගයේ පැති බැම්ම ” සංවර්ධනය කිරීම.

ඈ.<u>යථා පරිදි කල්දී ඇති ප්‍රශ්න</u>

- නැත -

ඉ.<u>යථා පරිදි කල් දී ඇති යෝජනා</u>

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතාගේ යෝජනා,</u>

<u>ඉ - 01</u>

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නිල ඇඳුම් හිමි නිලධාරින්ට හා කාර්ය මණ්ඩලයේ සේවක මහතුන්ට 2023 වර්ෂය සඳහා නිල ඇඳුම් දීමනාව ලබා දීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ඒ. නිශාන්ත ප්‍රදීප් කරුණාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රි මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ඒ. නිශාන්ත ප්‍රදීප් කරුණාරත්න මහතා</u>

නිල ඇඳුම් දුන්නට මේ සේවකයෝ නිල ඇඳුම් පැළඳගෙනද සේවයේ යෙදෙන්නේ? නමුත් මම නම් දකින්නේ නිල ඇඳුම් පළඳින්නේ නැති බවයි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා</u>

මේ වෙනුවෙන් කොපමණ මුදලක් යනවද?

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ක්ෂේත්‍ර නිලධාරීන්,සෞඛ්‍ය කම්කරුවන් වැනි අයටනේ

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඒ.ඒ. නිශාන්ත ප්‍රදීප් කරුණාරත්න මහතා</u>

මේ නිල ඇඳුම් කාටද දෙන්නේ?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

කාටද කියලා, මම ඉදිරි සභා වාරයේදී සභා ගත කරන්නම්. දැනට ක්ෂේත්‍ර නිලධාරීන් හා සෞඛ්‍ය කම්කරුවන්ට. කාරක සභා අවස්ථාවකට පත් කරන්න.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි ටී.ආර්. උපාලි විජේරත්න මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රි එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ සේවයේ නියුතු නිල ඇඳුම් හිමි නිලධාරින්ට හා කාර්ය මණ්ඩලයේ සේවක මහතුන්ට 2023 වර්ෂය සඳහා නිල ඇඳුම් දීමනාව ලබා දීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 02</u>

ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ යොදවා ඇති ආර්.ඩී මොහේන්ද්‍ර ගුණරත්න මයාගේ සේවා ගිවිසුම 2023.03.02 දිනෙන් අවසන් වන අතර, 2023.03.03 දින සිට 2024.03.02 දින දක්වා තවත් වසරක කාලයකින් දීර්ඝ කර ගැනීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී කේ.ඩී.එන් සුරංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත සෞඛ්‍ය කම්කරු තනතුරේ සේවයේ යොදවා ඇති ආර්.ඩී මොහේන්ද්‍ර ගුණරත්න මයාගේ සේවා ගිවිසුම 2023.03.02 දිනෙන් අවසන් වන අතර, 2023.03.03 දින සිට 2024.03.02 දින දක්වා තවත් වසරක කාලයකින් දීර්ඝ කිරීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 03</u>

ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත සේවයේ යොදවා ගෙන අයි.ජී.පී.පී කුමාර මයාගේ සේවා ගිවිසුම 2023.03.06 දිනෙන් අවසන් වන අතර , ඔහුගේ ඉල්ලීම හා සේවා අවශ්‍යතාවය මත 2023.03.07 දින සිට 2024.03.06 දක්වා වසරක කාලයකින් සේවා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත සේවයේ යොදවා ගෙන අයි.ජී.පී.පී කුමාර මයාගේ සේවා ගිවිසුම 2023.03.06 දිනෙන් අවසන් වන අතර , ඔහුගේ ඉල්ලීම හා සේවා අවශ්‍යතාවය මත 2023.03.07 දින සිට 2024.03.06 දක්වා වසරක කාලයකින් සේවා ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 04</u>

ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත සේවයේ යොදවා ගෙන කේ.ඩී.පී ප්‍රදිප් කුමාර මයාගේ සේවා ගිවිසුම 2023.03.04 දිනෙන් අවසන් වන අතර , ඔහුගේ ඉල්ලීම හා සේවා අවශ්‍යතාවය මත 2023.03.05 දින සිට 2024.03.04 දක්වා වසරක කාලයකින් සේවා ගිවිසුම දීර්ඝ කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඩබ්.ජී.එන්.පී ජයතිලක මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ශ්‍රමය මිලදී ගැනීමේ පදනම මත  සේවයේ යොදවා ගෙන කේ.ඩී.පී ප්‍රදීප් කුමාර මයාගේ සේවා ගිවිසුම 2023.03.04 දිනෙන් අවසන් වන අතර , ඔහුගේ ඉල්ලීම හා සේවා අවශ්‍යතාවය මත 2023.03.05 දින සිට 2024.03.04 දක්වා වසරක කාලයකින් සේවා ගිවිසුම දීර්ඝ කිරීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 05</u>

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ඉදල්පොල ඝණ අප ද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානයේ දෛනික කටයුතු සිදු කර ගෙන යාම සඳහා අවශ්‍ය පහත සඳහන් ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

- සීලර් මැෂින් 01
- 500 kg බර මැනිය හැකි තරාදියක්.
- ප්ලාස්ටික් බැරල් 10 ක්. ( 200 L )
- පොහොර කවර ( 50 X 100 , 25 X 100 , 10 X 100, 5 X 100 ) = 400

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඒ සරත් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ඉදල්පොල ඝණ අප ද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානයේ දෛනික කටයුතු සිදු කර ගෙන යාම සඳහා අවශ්‍ය ඉහත ද්‍රව්‍ය හා උපකරණ මිලදී ගැනීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 06</u>

පලාත් පාලන කොමසාරිස්ගේ අංක CLG / LG / 4 / 1 / 13 – 11 හා 2022.03.18 දිනැති ලිපිය අනුව සේවා අවශ්‍යතාවය සලකා රාජකාරි ඉටු කර ගැනීම සඳහා සුදුසු සෞඛ්‍ය කම්කරුවන් 07 ක් දෛනික කුලී ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව හේනේ ගෙදර , බටුවිට, රුවන්වැල්ල ලිපිනයේ පදිංචි ඊ.එම්.වී.ඩී එදිරිසිංහ මයා 2023.01.16 දින සිට වසරක කාල සීමාවකට රු.1318.00 ක දෛනික දීමනාවක් යටතේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස සේවයේ යොදවා ගැනීමට ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා</u>

මේ යෝජනාව සම්බන්ධව ගැටළුවක් තියෙනවා.සෞඛ්‍ය කම්කරුවන් බඳවා ගෙන, සෞඛ්‍ය කම්කරුවන් විදිහටම සේවයේ යොදවා ගන්න ඕනි.මට අවස්ථා ගණනාවකදීම දැන ගන්න ලැබුණා, JCB ඔපරේටර්වරු ගොඩක් අවස්ථා වලදී දීර්ඝ නිවාඩු ගන්නවා. ඒ අවස්ථා වලදී වැඩ කරගෙන යන්න බැරි වෙනවා. කවුරුත් ඒකට ආදේශක නෑ. දෛනික පදනම මත ගන්නා එක්කෙනෙක් හෝ දෙන්නෙක් පුහුණු ශ්‍රමිකයින් වුණා නම් ස්ථිර අය නොමැති අවස්ථා වලදී අපහසුතාවයන් වෙන්නේ නෑ. ඒ නිසා කම්කරු මහතෙක් බඳවා ගැනීමේදී සොයා බලා බඳවා ගන්න එක හොඳයි. යම් තාක් දුරට හෝ පුහුණුවක් තියෙන කෙනෙක් බඳවා ගන්නවා නම් සුදුසුයි. එහෙම වුනොත් අවස්ථාව අනුව යම් කෙනෙක් නිවාඩු ලබා ගන්නවා නම් ඒ බඳවා ගන්නා අය සේවයේ යොදවා ගත හැකියි. ඒ ගැන සලකා බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

මාර්ග කම්කරුවෝ ඉන්නේ දෙන්නයිලු තණකොල කපන මැෂින් එකෙන් තණකොල කපන්න. අපේ කම්කරු මහත්තයෙක් මිය ගිය හින්දා එක්කෙනෙක් එතනට දාලා කියනවා. අපි 07 ක් බඳවා ගත්තා. අසීමිත ප්‍රමාණයක් ට්‍රැක්ටරේ යනවා. ප්ලාස්ටික් එකතු කරන දින දෙකේ පිටිපස්සේ ලොරියේ 03ක් යනවා. ඉස්සරහත් 02 ක් විතර

යනවා. ගම් වලට ඇවිල්ලා තණකොල කපන මැෂින් වලින් ගම් වලට ඇවිල්ලා වැඩ කරනවා පුද්ගලයෝ. ඒ ගොල්ලන්ට කථා කරලා , ප්‍රාදේශීය සභාවේ මෙහෙම අවස්ථාවක් තියෙනවා කිව්වා නම් හොඳයි. මැෂින් වල කාර්මික දැනුමත් එක්ක ගත්තොත් සභාවට පහසුයි. පාරවල් සුද්ධ කරන එක ප්‍රාදේශීය සභාවෙන් ගිලිහිලා තියෙනවා. හැමෝම කියනවා, ප්‍රාදේශීය සභාවෙන් පාරවල් නඩත්තු වෙන්නේ නෑ කියලා. හොඳ කම්කරු මහත්තුරුන්ගෙන් team එකක් හැදුවා නම් හොඳයි. විශේෂයෙන්ම ඉන්ධන දෙනකොට අවධානය යොමු කල යුතුයි. මට මතකයි . මම හිටපු කාලේ ඉන්ධන ප්‍රශ්නයක් ආවා. උදේ 11 ටත් එයාලට ඉන්ධන නෑ. එයාල භාර මහත්තයෙක් ඉන්නවා නම්, එයාල යන rood එක බලලා , තෙල් ටික අරගෙන උදේම පිටත් කරන්න ඕනි. පෙරේදා අපි යද්දි එකොළහ හමාරයි. රුවන්වැල්ල කනත්ත ගාව ඉස්සරහ ටික කැපුවා. දෙක වෙනකොට මෙයාල එනවා. අව්ව සැරයි. කරන්න බෑ. තෙල් උදේ ගන්න බැරි වුනා කිව්වා. ඇත්ත කථාව. ඒ කම්කරු මහත්තුරුන්ට තෙල් දුන්නොත් තමා එයාලා ගිහින් වැඩ කරන්නේ. එයාලට ඉන්න forman මහත්තයා ඉදිරි දවසට ඕන කරන තෙල් ටික අරගෙන , යන්න අවශ්‍ය shadule ටික අරගෙන , ඒ කාර්යයන් ක්‍රියාත්මක කරනවා නම් මේවා ගොඩාක් කාර්යක්ෂම වෙයි. සුදුසු කම්කරුවන් බඳවා ගමු කියලා මම යෝජනා කරනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පලාත් පාලන කොමසාරිස්ගේ අංක CLG / LG / 4 / 1 / 13 – 11 හා 2022.03.18 දිනැති ලිපිය අනුව සේවා අවශ්‍යතාවය සලකා රාජකාරි ඉටු කර ගැනීම සඳහා සුදුසු සෞඛ්‍ය කම්කරුවන් 07 ක් දෛනික කුලී ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව හේනේ ගෙදර , බටුවිට, රුවන්වැල්ල ලිපිනයේ පදිංචි ඊ.එම්.වී.ඩී එදිරිසිංහ මයා 2023.01.16 දින සිට වසරක කාල සීමාවකට රු.1318.00 ක දෛනික දීමනාවක් යටතේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස සේවයේ යොදවා ගැනීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 07</u>

2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව බැහැර කිරීමට නියමිත වූ පහත විස්තර කෙරෙන රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම සඳහා මු.රේ. 770 (4) (ආ) යටතේ 2023.02.02 දින පැවති අපහරණය කල යුතු වාහන / යන්ත්‍ර සූත්‍ර තක්සේරු කිරීමේ කමිටුවේ නිර්දේශ ලැබී ඇත. එම නිර්දේශ අනුව අංක 67 – 0126 ටේලරය, SGJB 5989 ටේලරය, එක් අයකුට ගොඩවී ක්‍රියාකල හැකි තණකොල කපන යන්ත්‍රය, SAKAI Vibrating යන්ත්‍රය, හා අත් ට්‍රැක්ටරය සහිත තණකොල කපන යන්ත්‍රය, යන වාහන / යන්ත්‍ර ලියාපදිංචිය අවලංගු කර යකඩ බරට වෙන්දේසි කිරීමටත්, අංක SGLF – 4866 මහේන්ද්‍රා කැබ් රථය හා අංක SGGI 3649 යතුරු පැදිය යන වාහන ලියාපදිංචි සහතිකය සමඟ වෙන්දේසි කිරීමටත්, අංක 75 – 7755 ලෙස නම් කර ඇති වාහනයේ ලියාපදිංචියක් නොමැති බැවින් , අමතර කොටස් ලබාගැනීම සඳහා වෙන්දේසි කිරීමටත්, අංක 49 – 7108 ටැක්ටරය ලියාපදිංචිය අවලංගු කර අමතර කොටස් හා යකඩ සඳහා වෙන්දේසි කිරීමටත් නිර්දේශ කර ඇත. මෙම නිර්දේශ ක්‍රියාත්මක කර, අදාල වෙන්දේසිය සිදුකර වාහන කොටස් බැහැර කිරීම සඳහා ගරු මහ සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

යන්ත්‍ර හරි වාහන හරි විකුණද්දි ලියාපදිංචිය අවලංගු කරාට පස්සේ ගන්න කෙනාට වැඩකුත් නෑ. සභාවට මේක repair කරලා ගන්නත් බෑ. අනිත් එක සමහර වාහන වල පොත් අස්ථානගත වෙලා. නැති වෙලා කියනවා. ඒවගේ ගැටළු එන්නේ කොහොමද? පොත නැති වුනේ කොහොමද කියලා නිලධාරින්ගෙන් අහ ගන්න වෙනවා. සමහර විට මේවා දෙවෙනි පාරකට විකුණන්න එහෙම යනවද දන් නෑ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

කියන්න බෑ ඉතින්.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

ඒ ගැන හොයලා බලන්න ඕනි. වාහන ලියාපදිංචි කරලා තියෙන මෝටර් රථ ලියාපදිංචි කිරීමේ කාර්යාලයේ මේ ගැන විස්තර ඇති. ඒ වාහනේ පොත කොහාට හරි ගිහිල්ලා තියෙනවා නම් ඒකත් හොයා ගන්න පුළුවන්. නිලධාරින් විසින් සමහර විට මේ වගේ දේවල් කරන්න ඉඩ තියෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

අපේ ගරු රාජා හතරසිංහ මන්ත්‍රිතුමා , ගරු සරත් මන්ත්‍රිතුමා ඇතුළු කණ්ඩායමක් හැටියට ස්ථානීය පරීක්ෂණයක් කලා. විශේෂයෙන්ම ට්‍රැක්ටර් ටික. මෙතන ට්‍රැක්ටර් 06 ක් විතර තියෙනවා අංගනය ඇතුලේ. ඒවා හදන්න පුළුවන්. මහේන්ද්‍රා කැබ් රථය වෙන්දේසි කරමු කියලා ඔයිට ඉස්සරත් අපි යෝජනා කලා. ඊට අමතරව 53 singal කැබ් එකක් තියෙනවා. තණකොළ වලින් වැහිලා අපි ඒක එළියට ගත්තා. ඒකේ පොත තියෙන්නේ පලාත් සභාවෙලු. ඒවා සභාවට ආදායම් කර ගන්න තියෙන දේවල්. ඒවා ඔක්කොම එකලස් කරලා වෙන්දේසි කලොත් ලොකු මුදලක් ගන්න පුළුවන්. මම ඉන්න කාලේ අර ford ට්‍රැක්ටරේ හැදුවා , නිල් පාට එක. ඒක අපි ගලි අදින්න පාවිච්චි කරනවා. ඒ ford ට්‍රැක්ටරේ ලක්ෂ 50 ක් විතර වටින ට්‍රැක්ටරයක්. අවුරුදු 08 ක් විතර එක තැන තිබ්බේ, හයිඩ්‍රොලික් පද්ධතියේ තිබ්බ ප්‍රශ්නයක් නිසා. පොම්පේ වැඩ කරන් නෑ. රු.9000.00 යි ගියේ. සැම්සන් මහත්තයාගේ ගැරිජ් එකට දාලා අපි ඒක හැදුවා. හදලා අළුතින් හයිඩ්‍රොලික් ඔයිල් ටික දාලා ඒක යාවත්කාලීන කරලා දැන් ධාවනය කරනවා. ඉතුරු ට්‍රැක්ටර් 02 – 03 ත් ධාවනය කරන්න පුළුවන්. අළුත් ටයර් තියෙන්නේ. එක ට්‍රැක්ටරයක් හරි මරද ගහ මුලට ගෙනිහින් හදන්න පුළුවන් නම් , සියළු මන්ත්‍රීවරු මේ යෝජනාවට අනුමැතිය දෙනවා. මම අනුමැතිය නැති කාලේ ඔය ට්‍රැක්ටර් ටික හැදුවේ. මට ආරංචියි, ගලි ට්‍රැක්ටරේ පිටි පස්සේ seal එක ගිහිල්ලා ගලිය වැඩ නෑ නේද?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

ඒක හදලා ගෙනාවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

හදලා ගෙනාවද? ඒ වගේ. වැඩකට ගන්න පුළුවන් දේවල්නේ. ඒ නිසා මම යෝජනා කරනවා අර ට්‍රැක්ටර් ටිකත් මොනවා හරි කරන්න කියලා. අංගනය සුද්ධ කරලා අපි ට්‍රැක්ටර් ටික එක පැත්තකට ගාල් කලා. ඔබ තමුන්නාන්සේලා ගිහිල්ලා බලන්න ඇති. ඒවටත් මුදල්මය වටිනාකමක් එනවා හදලා ගත්තොත්, සභාවේ සම්පත් හැටියට පාවිච්චි කරන්න.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

මේ රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර පිලිබඳ කමිටු වාර්තාව බලන්න මං සභාගත කරනවා. ඕකේ ඉංජිනේරු වාර්තා තියෙනවා.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.නයනජිත් පුෂ්ප කුමාර මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2021.12.31 දිනෙන් අවසන් වර්ෂයේ භාණ්ඩ සමීක්ෂණ නිර්දේශ අනුව බැහැර කිරීමට නියමිත රථ වාහන හා යන්ත්‍ර සූත්‍ර අපහරණය කිරීම සඳහා මු.රෙ. 770 (4) (ආ) යටතේ 2023.02.02 දින පැවති අපහරණය කල යුතු වාහන / යන්ත්‍ර සූත්‍ර තක්සේරු කිරීමේ කමිටුවේ නිර්දේශ අනුව අංක 67 – 0126 ටේලරය, SGJB 5989 ටේලරය, එක් අයකුට ගොඩවී ක්‍රියාකල හැකි තණකොල කපන යන්ත්‍රය, SAKAI Vibrating යන්ත්‍රය, හා අත් ට්‍රැක්ටරය සහිත තණකොල කපන යන්ත්‍රය, යන වාහන / යන්ත්‍ර ලියාපදිංචිය අවලංගු කර යකඩ බරට වෙන්දේසි කිරීමත්, අංක SGLF – 4866 මහේන්ද්‍රා කැබ් රථය හා අංක SGGI 3649 යතුරු පැදිය යන වාහන ලියාපදිංචි සහතිකය සමඟ වෙන්දේසි කිරීමත්, අංක 75 – 7755 ලෙස නම් කර ඇති වාහනයේ ලියාපදිංචියක් නොමැති බැවින් , අමතර කොටස් ලබාගැනීම සඳහා වෙන්දේසි කිරීමත්, අංක 49 – 7108 ටැක්ටරය ලියාපදිංචිය අවලංගු කර අමතර කොටස් හා යකඩ සඳහා

වෙන්දේසි කිරීම මගින් වාහන කොටස් බැහැර කිරීමත් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 08

2022.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පවත්වන ලද ප්‍රාදේශීය සභාවට අයත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාවද, එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා කමිටුවක් පත් කර ගැනීමටද ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර්. උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

මේ වාර්තාවේ නිර්දේශ ක්‍රියාත්මක කිරීමට පහත කමිටුව සුදුසුයි කියලා මම හිතනවා.

කමිටු සභාපති - පී.ආර් පතිරණ මහතා - ප්‍රධාන කලමනාකරණ සේවා නිලධාරි.

කමිටු සාමාජික - පී.ඒ පියරත්න මහතා - කලමනාකරණ සේවා නිලධාරි.

කමිටු සාමාජික - පී.එම්.ඒ සමරසිංහ මහතා - සංවර්ධන නිලධාරි

කමිටු සාමාජික - එම්.ටී.ඩී අමාලි මහත්මිය - කාර්මික නිලධාරි

කමිටු සාමාජික - ඊ.කේ.බී.එස් ඒකනායක මහතා - ආදායම් පරීක්ෂක.

කමිටු සාමාජික - පී.ටී වික්‍රමසිංහ මහත්මිය - සංවර්ධන නිලධාරි

2022.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පවත්වන ලද ප්‍රාදේශීය සභාවට අයත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හා එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත කමිටුව පත් කිරීම සුදුසුය යන ප්‍රකාශය සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2022.12.31 දිනෙන් අවසන් වර්ෂයට අදාලව පවත්වන ලද ප්‍රාදේශීය සභාවට අයත් භාණ්ඩ සමීක්ෂණ වාර්තාව හා එම වාර්තාවේ සඳහන් නිර්දේශ ක්‍රියාත්මක කිරීම සඳහා ඉහත කමිටුව පත් කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතාගේ යෝජනාව

ඉ - 09

රුවන්වැල්ල නගරයේ භූගත කඩ කාමර 05 සඳහා දැනට අය විය යුතු අධි භාර ගාස්තු වන රු.2,327,975.00 ක මුදල පොදු වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අධි භාර ගාස්තු කපා හරින ලද ක්‍රම වේදය අනුව කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම 02 )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී ආර්.ඒ.සී පුෂ්ප කාන්ති මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවට කරුණු ටිකක් ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා. මේ සම්බන්ධව කරුණු ඉදිරිපත් කිරීමේ ගැටළුවක්, සන්නිවේදනයේ ප්‍රශ්නයක් තිබුනා. ඒ වෙනකොට පොදු වෙළඳ සංකීර්ණයේ කඩ වල අධි භාර ගාස්තු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියෙන් අයින් කරලා තිබුනා. හැබැයි තව පිරිසක් ඉන්නවා. මේ ඇමුණුමක් දාලා තිබුනා. අපිට පැහැදිලිව මේකේ විස්තර ලැබුනේ නෑ. පොදු වෙළඳ සංකීර්ණයේ අයින් කරපු නිසා තමයි මේ භූගත කඩ කාමර වලත් ඉල්ලන්නේ. භූගත කඩ කාමර වලට මං ගිහිල්ලා අහද්දි කිව්වේ ගෙවන්ඩ නෑ කියලා. ලක්ෂ 06 ක් කඩ කුලී ගෙව්වා කියලා අතුල මහත්මා කිව්වා. මේ කට්ටිය හිග නෑ කිව්වට, මේ හිග තියෙන එක ඒ කට්ටිය හිතන් ඉන්නේ අයින් කරලා ඉවරයි කියලා. ඒ කට්ටිය එහෙමයි කිව්වේ. පොදු වෙළඳ සංකීර්ණයේ අයින් කරපු නිසා ඒ කට්ටිය හිතුවලු අයින් කරල ඇති කියලා. පොදු වෙළඳ සංකීර්ණයේ අයින් කරපු නිසා, මං කිව්වා එහෙම නම් මේකටත් ඒ සහනය දෙන්න. අපි වැරැද්දක් කරලා තියෙනවා කියලා සභාවෙදි කිව්වා. මමනේ

ඒකට විරුද්ධ වෙලා අයින් කරන්න කියලා ඉල්ලීම කලේ. භූගත වලට ඒක දෙන්න බෑ. ඇයි මේ භූගත කඩ කාමර වලට විතරක් ගෙවන්න තියෙන්නේ කියලා මමයි කථා කලේ. මම දන්නෙත් නෑ පොදු වෙළඳ සංකීර්ණයේ මෙහෙම අයින් කරලා තියෙනවා කියලා. ඒක පැහැදිලිව තිබුනා ඇමුණුම් වලත්. ඒක නිසා ඒක නිවැරදි කරන්න තමයි , මම ඒක ඉල්ලා හිටියේ. මම ඒ යෝජනාව දැම්මා. ඔක්කොටම එක සමාන විය යුතුයි කියලා පදනමේ ඉදලා තමයි යෝජනාව දැම්මේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

මෙතන රු. 2,327,175.00 ක මුදලක් තමා කපා හරින්න ඉල්ලන්නේ. අද උදේ මටත් කථා කලා මාකට් එකේ ව්‍යාපාරික මහතෙක්. එයත් එහෙම ඉල්ලීමක් කරලා තියෙනවා. අධි භාර ගෙවලා තියෙනවා. එයාටත් ඒ පහසුකම ලබා දෙන්න කියලා. කඩ කාමර 05 ට අදාල අපි ඇමුණුම 02 ට ගියාම , ලොකු මුදලක් තියෙනවා ඇත්තටම අධිභාරය කියන එක. එතකොට එක් එක් වශයෙන් ගත්තාම?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

වැඩිම තියෙන්නේ අතුලගේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

ඒක ඇමුණුම 02 එකනේ. රු.2,327,975.00 ක්. මේකේ printing mistake එකක් තියෙනවා. ටී.කරුණාරත්න මහත්තයා රු.27, 400.00 යි. රංජිත් කලංසූරිය මහත්තයා රු.195,300.00. අපිට දීලා තියෙන සභා යෝජනාව එකක්. ඇමුණුම එකක්.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

එකසිය හැත්තෑ පහයි. නවසිය හැත්තෑ පහයි දෙකක් තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

ලොකු මුදලක් තියෙන්නේ. ඇමුණුම 04 ට යන්නකෝ. ඒකේ වජී.ජී සරත් කුමාර මහත්තයාගේ 28 කඩ කාමරය. එස්.එම් ෆාහිම් මහත්තයාගේ 30 කඩ කාමරය. 8B කඩ කාමරය නස්ලම් මහත්තයාගේ. එතන තියෙනවා 2,005,175.00 ක්. ගරු මන්ත්‍රිවරුනේ අපි හිතන්න ඕනි මේක. මේ යෝජනාව අපි ස්ථිර කරලා දුන්නා කියමු. ආණ්ඩුකාරතුමාට මේ යෝජනාව යනවා. එතකොට සභාවට අය විය යුතු මෙච්චර මුදල් ප්‍රමාණයක් කඩ හිමියෝ 08 දෙනයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

මංජුල මන්ත්‍රීතුමා , මේක මං පැහැදිලි කර ගත්තා. මෙතන භූගත කඩ කාමර වල අපි කිසි දවසක අයින් කරලා නෑ. හැබැයි මේ කියන අයගේ යම් කිසි කාල වකවානුවක අයින් කරලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

කොයි කට්ටියගේද?

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

ඔය කියපු නාම ලේඛනයේ. අංක 04 ඇමුණුමේ. මෙතන පැටලිල්ල මේකයි. භූගත කඩ කාමර ටිකේ අයට අපි කවදාවත් සහනය ලබා දීලා නෑ. පොදු වෙළඳ සංකීර්ණය තුල මේ සහනය ලබා දිලා තියෙනවා. ලබා දීලා නැවත වතාවක් හිග වෙලා තමයි , මම දන්න විදියට තියෙන්නේ. එතකොට ආණ්ඩුකාරතුමාට මේක යැවුවාම, පලවෙනි වතාවේ සහන දුන්න අයට නැවත වතාවක් සහන දෙයිද මම දන්නේ නෑ. හැබැයි මම ඒ යෝජනාවට අදාල නෑ. මං ඒ යෝජනාව දැම්මේ නෑ. භූගත කඩ කාමර වල අයට මේ සහනය ලබා දීලාම නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

එහෙනම් නිලධාරියා ඒක නිවැරදි කරන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

පොදු වෙළඳ සංකිර්ණයේ අය මේ සහනය ලබා ගෙන තියෙනවා. භූගත අයට මේ සහනය ලබා දීලා නෑ. මං පහුගිය සභාවෙදි යම් වැරැද්දක් කලා. ඒ වැරැද්ද කලේ , භූගත කඩ කාමර සම්බන්ධයෙන් ආපු යෝජනාවට මම කථා කරලා ඒක ප්‍රතික්ෂේප කලා. මේක දෙන්න බෑ කියලා. හැබැයි මේක මීට පෙර දීලා තියෙනවා. පොදු වෙළඳ

සංකීර්ණයට දීලා තියෙනවා නම් , භූගත කඩ කාමර වල අයට නොදෙන්න හේතුවක් නෑ. ඒක දිය යුතුයි. හැබැයි මේ කාරණය තුලදි මම දකිනවා, මේ සහන ලබා ගෙන නැවත වතාවක් හිග තිබ්බාද කියන ප්‍රශ්නය තියෙනවා. ඒක ආණ්ඩුකාරතුමා ගාවට ගියාට පස්සේ පැහැදිලි උත්තරයක් ලැබෙයි. ලබා දුන්න හැකිද? නැද්ද කියලා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

මේකෙදි මම දකින දේ මේක. අපිට ඇවිල්ලා තියෙන ඇමුණුම 02 හි පැහැදිලිව තියෙනවා. එයාලගේ අධි භාරය ප්‍රථම වතාවට ඉවත් කරලා නැත්නම් දෙමු කියලා ඔබතුමා කියනවා. පොදු වෙළඳ සංකිර්ණයේ යම් කිසි කොටසක් මේ වරප්‍රසාදය භුක්ති විඳලා තියෙනවා. නමුත්, එයාලා දෙවෙනි වතාවටත් ඉන්නවා කියලා තියෙනවා ඇමුණුම 04 . අපේ නිලධාරි අපිට මේ ලේඛනය එවද්දි ඇමුණුම 01 දි මෙච්චර අධිභාරයක තියෙන මුදලක් අපෙන් අනුමැතිය ගන්න එවද්දි කියන්න ඕනි, මේ ප්‍රථම වතාවට සභාවට දාන්නේ කියන එක. මන්ත්‍රීවරු මේවා සම්බන්ධව දැනුවත් වෙන්න ඕනි. අපේ උප සභාපතිතුමා, මම මේ කියන කරුණ පිලිබඳව දැනුවත් වෙන්න. ව්‍යාපාරිකයින් 5 දෙනෙකුට දෙන්න අපි සභා අනුමැතියක් ගන්නවා. මේක ප්‍රථම අවස්ථාව වෙන්න පුළුවන්. උපාලි මන්ත්‍රිතුමා කිව්වා , ගිය සභාවෙදි අතපසු වීමක් වුනා. ඒක නිවැරදි කර ගන්න යෝජනා කරනවා කියලා. අපි ඒකමතිකව සම්මත කරලා මේක ආණ්ඩුකාරතුමාට යවද්දි , එතුමා කල්පනා කරන්න පුළුවන්, ප්‍රථම වතාවට කණ්ඩායමකුත් ඉන්නවා. පොදු වෙළඳ සංකීර්ණයේ ඇමුණුම 4 හි වරප්‍රසාද ගත්තු අයගේ කණ්ඩායමකුත් ඉන්නවා. යෝජනාව ස්ථිර කරලා යැවුවොත් ඒ කට්ටියත් නැවත සැරයක් යනවා. මොනවද මේ යෝජනා ස්ථිර කරලා එවන්නේ කියලා එතුමටත් ප්‍රශ්නයක් එනවා. අපිට මේක පැහැදිලි වෙන්න ඕනි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

කාරක සභා අවස්ථාවක් යෝජනා කරන්න.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

අපි මේක අනුමත කරලා යැවුවා කියමුකෝ. ලොකු මුදලක් එක්ක අපි මේ සෙල්ලම් කරන්නේ. එහෙම යවලා අපිට හාස්‍යයට ලක් වෙන්න බෑ. අපේ නිල කාලය ඉවර වෙලා අපි ගෙදර යන්න පුළුවන්. නැවත සභාවක ඉන්න පුළුවන්. නැති වෙන්න පුළුවන්. ගන්න තීන්දු තිරණ වලදි අපි දෙන අනුමැතිය බොහොම ගැඹුරින් හිතන්න ඕනි කියලයි කියන්නේ. වරප්‍රසාද කියන එක අද කාලේ හැටියට සියල්ලට දිය යුතුයි. එයාලා පෞද්ගලිකවත් අපට කථා කලා. හැබැයි මේකේ විනිවිද භාවයක් තියෙන්න ඕනි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ කරුණාරත්න මහතා</u>

අපේ මන්ත්‍රීතුමා කිව්වා වගේ මේක මැතිවරණයක් අභයස. මෙතුමාගේ පෞද්ගලික යෝජනාවකින් මේක ඉදිරිපත් කරලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

ඒක තමයි මං අහන්නෙත්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

පෞද්ගලික යෝජනාවක් දාන්න හේතු වුනේ මම කිව්වා එක වැරැද්දක් කලා කියලා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

ඔබතුමා ඒක නිවැරදි කර ගන්න ඕනි කියලා යෝජනාව ස්ථිර කර ගන්නට දැම්මාට , සභාවක් හැටියට තීන්දු තීරණ ගද්දි අපිටත් වගකීමක් තියෙනවනේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

09 වෙනි යෝජනාවට අදාලව තමයි මේක.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

ඔයිට පෙරත් ඔබතුමාගෙන් අතපසු වෙච්ච දේවල් සභාවේ යාවත් කාලින කර ගන්න , නිවැරදි කර ගන්න යෝජනා ස්ථිර කරලා තියෙනවා. අපි ප්‍රශ්නයක් ගැන දැනුවත්ව, නොදැනුවත්ව කථා කරනවා. හැබැයි මේකෙදි ඒ පුද්ගලයෝ සතුටු කරන්න කියලා යෝජනාව ගෙනල්ලා, අපි ස්ථිර කරන්න ආණ්ඩුකාතුමාට යවන්න හැදුවොත් ගරු මන්ත්‍රීවරුනේ , අපිට මේක අභ්‍යන්තර ගැටළුවක් වෙයි කියලා මම දකිනවා. මෙතන ලොකු මුදලක්. ඇමුණුම 04 හිත් ලොකු මුදලක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

**09 වෙනි යෝජනාවට අදාලව තියෙන්නේ අංක 02 ඇමුණුම. 04 වෙනි එකේ තමා අර ගාන තියෙන්නේ.**

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ කරුණාරත්න මහතා

මං ඒක පැහැදිලි කර ගත්තා. මම මේක කියවලා බැලුවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ කරුණාරත්න මහතා

මෙතුමගේ එක විතරක් නෙමේ, තව එකක් එනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

ඒක තමයි මම අහන්නේ. දැන් ගරු මන්ත්‍රීතුමා ඇමුණුම 02 දැකලා, 04 ත් අපි දැකපු නිසානේ කියන්නේ. ඔබතුමා ඇමුණුම 02 ගැන සාධාරණියකරණයක් කරනවා. ඒක තමයි මට තියෙන ප්‍රශ්නය. ඇමුණුම 02 , 04 එනකොට , 04 ට යෝජනාවක් නැතුව කොහොමද යෝජනාවක් එන්නේ? 02 ට යෝජනාවක් තියෙනවා. 04 ට කොහොමද එන්නේ?

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා

04 යෝජනාවක් තියෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ කරුණාරත්න මහතා

හරි අපි ඒක කථා කරමුකෝ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා

සියළු දෙනා ඉල්ලුවා කඩ කුලිය ගෙවන්න දෙන්න කියලා. කඩ කුලිය ගෙවන්න කැමතියි. දඩය ඉවත් කරන්න කියලා. ඊට පස්සේ සභාවේ යෝජනාවක් සම්මත කරලා , ආණ්ඩුකාරතුමාට යැව්වා. ආණ්ඩුකාරතුමා අනුමත කරලා සභාවට දැනුම් දුන්නා, ඒ අයගේ අධි භාරය කපන්න කියලා. ඒ අනුව පොදු වෙළඳපලේ අධි භාර කපා හැරියා. ඒක ඇමුණුමේ තියෙනවා. ඒ අනුව ඊට පස්සේ භූගත කඩ කාමර වල අය ඉල්ලීමක් කරා , මේක අපිටත් සාධාරණයි. ඒ අයගේ කපා හැරියා නම් අපෙත් අධි භාර කපා හරින්න. අපි මුදල ගෙවනවා. අධි භාරය කපා හරින්න කියලා. දැන් අසාධාරණයක් වෙලා තියනවා, මාකට් එකේ අධි භාර ගෙවපු නැති අයගේ කපා හැරියා. ගත්තු අයගේ කුලියට හිලවු කරනවා ඉදිරියට. එතකොට දැන් මෙතන ඉල්ලන්නේ ගෙවපු අයගේ එකත් ඉදිරියේදි ඒ කුලියට හිලවු කරන්න. ගෙවපු අයට ඒ සහනය දෙන්න කියලා. ඒක සාධාරණයි. එක පැත්තකින් එක කට්ටියකට දීලා, දෙගොල්ලකින් ඉල්ලීම් ආපුවම අනික් කට්ටියට නොදී ඉන්න බෑනේ. හැබැයි මේක සභාවට ආපු වෙලාවේ ඒ යෝජනාවේ පොඩි අපැහැදිලිකමක් තිබුනා. ඒ නිසා තමා ඔබතුමා විරුද්ධ වුනේ. ඊට පස්සේ විෂය නිලධාරිත් කථා කලා. ඒ කථා කරාම, අපි එවලේ තමා දැනුවත් වුනේ. අපි කිව්වා, මේකේ පොඩි ප්‍රශ්නයක් ආවා. හරි යෝජනාවක් ඉදිරිපත් කරන්න කියලා. ඒ අනුව ඒ යෝජනාව දෙවෙනි වරටත් ඉදිරිපත් වුනා. ඔබතුමාගේ පෞද්ගලික යෝජනාවක් හැටියට ඉදිරිපත් වෙලා තියෙන්නෙත් ඒකමයි. මෙතන යෝජනා 02 ක් තියෙනවනේ. දෙවෙනි එක භූගත කඩ කාමර වලට. ඒක සාධාරණයි. ඒක නිසා ,අපි ඒක ස්ථිර කරලා, ඒ කාර්යය කරන්න ඕනි. මාකට් එකේ අධි භාර කපා හැරපු අය නැවත සහන ඉල්ලනවා නම් , ඒවා සම්බන්ධ යෝජනාව ආපුවම අපි ඒකෙන් වැඩ කරමු. මෙතෙන්දි ඒක ගන්නේ නැතුව.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

මේ යෝජනාවට අදාලව ක්‍රියාත්මක කරමු. මේක අනික් යෝජනාවට අදාල කර ගන්න එපා.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල නගරයේ භූගත කඩ කාමර 05 සඳහා දැනට අය විය යුතු අධි භාර ගාස්තු වන රු.2,327,975.00 ක මුදල පොදු

වෙළඳ සංකීර්ණයේ කඩ කාමර සඳහා අධි භාර ගාස්තු කපා හරින ලද ක්‍රම වේදය අනුව කපා හැරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමා වෙත යැවීමට කටයුතු කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතාගේ යෝජනා,</u>

<u>ඉ - 10</u>

2023 වර්ෂයේ ජනවාරි මසට අදාලව ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද ( ලක්ෂ 05 ට අඩු ), රු. 9,324,813.99 ක වියදම් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි. (ඇමුණුම් අංක 03 )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එච්.නයනජිත් පුෂ්ප කුමාර මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයේ ජනවාරි මසට අදාලව ආවරණ අනුමැතියට යටත්ව දරණ ලද ( ලක්ෂ 05 ට අඩු ), රු. 9,324,813.99 ක වියදම් අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 11</u>

2013.01.01 දිනට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කාර්ය මණ්ඩල තොරතුරු අනුව , රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට වැඩ ක්ෂේත්‍ර අධික්ෂක තනතුරු 01 ක් අනුමතව ඇති අතර, එම තනතුර මේ දක්වා පුරප්පාඩුව පවතී. දැනට එම පුරප්පාඩුවේ රාජකාරී ආවරණය කරනුයේ මෙම ආයතනයේ සේවයේ නියුතු ජේ.ඒ.එස්.කේ ජයකොඩි මයා විසිනි. ඔහු දැනට 2014.04.01 දින සිට වැඩ ක්ෂේත්‍ර කම්කරු ලෙස සේවය කරන අතර 2019 වර්ෂයේ සිට මේ දක්වා අඛන්ඩව වැඩ ක්ෂේත්‍ර අධික්ෂක තනතුරේ රාජකාරි ආවරණය කරන බැවින්, ජේ.ඒ.එස්.කේ ජයකොඩි මයාගේ තනතුර වැඩ ක්ෂේත්‍ර අධික්ෂක ලෙස සංශෝධනය කිරීමටත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමටත් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී කේ.ඩී.එන් සුරංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2013.01.01 දිනට කලමනාකරණ සේවා දෙපාර්තමේන්තුව මගින් අනුමත කාර්ය මණ්ඩල තොරතුරු අනුව , රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට වැඩ ක්ෂේත්‍ර අධික්ෂක තනතුරු 01 ක් අනුමතව ඇති අතර, එම තනතුර මේ දක්වා පුරප්පාඩුව පවතී. දැනට එම පුරප්පාඩුවේ රාජකාරී ආවරණය කරනුයේ මෙම ආයතනයේ සේවයේ නියුතු ජේ.ඒ.එස්.කේ ජයකොඩි මයා විසිනි. ඔහු දැනට 2014.04.01 දින සිට වැඩ ක්ෂේත්‍ර කම්කරු ලෙස සේවය කරන අතර 2019 වර්ෂයේ සිට මේ දක්වා අඛන්ඩව වැඩ ක්ෂේත්‍ර අධික්ෂක තනතුරේ රාජකාරි ආවරණය කරන බැවින්, ජේ.ඒ.එස්.කේ ජයකොඩි මයාගේ තනතුර වැඩ ක්ෂේත්‍ර අධික්ෂක ලෙස සංශෝධනය කිරීමත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනීමත් අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 12</u>

පලාත් පාලන කොමසාරිස්ගේ අංක CLG / LG / 4 / 1 / 13 – 11 හා 2022.03.18 දිනැති ලිපිය අනුව සේවා අවශ්‍යතාවය සලකා රාජකාරි ඉටු කර ගැනීම සඳහා සුදුසු සෞඛ්‍ය කම්කරුවන් 07 ක් දෛනික කුලී ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව , E 342 / 2 ගෝණගල උතුර , වහකුල, රුවන්වැල්ල ලිපිනයේ පදිංචි එන්.ජී.ආර්.කේ ධර්මසිරි මයා 2023.01.16 දින සිට වසරක කාල සීමාවකට රු.1318.00 ක දෛනික දීමනාවක් යටතේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස සේවයේ යොදවා ගැනීමට ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනී කේ.ඩී.එන් සුරංගනී මහත්මිය විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, පලාත් පාලන කොමසාරිස්ගේ අංක CLG / LG / 4 / 1 / 13 – 11 හා 2022.03.18 දිනැති ලිපිය අනුව සේවා අවශ්‍යතාවය

සලකා රාජකාරි ඉටු කර ගැනීම සඳහා සුදුසු සෞඛ්‍ය කම්කරුවන් 07 ක් දෛනික කුලී ගෙවීමේ පදනම මත සේවයේ යොදවා ගැනීමට අනුමැතිය ලබා දී ඇත. ඒ අනුව , E 342 / 2 ගෝණගල උතුර , වහකුල, රුවන්වැල්ල ලිපිනයේ පදිංචි එන්.ජී.ආර්.කේ ධර්මසිරි මයා 2023.01.16 දින සිට වසරක කාල සීමාවකට රු.1318.00 ක දෛනික දීමනාවක් යටතේ සෞඛ්‍ය කම්කරුවෙකු ලෙස සේවයේ යොදවා ගැනීම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 13</u>

2023 වර්ෂයට විජී පහන් නඩත්තුව සඳහා විජී පහන් උපාංග මිලයට ගැනීමට අදාලව රු.967,000.00 ක් " මහ වැව මිෂෙලි ඉලෙක්ට්‍රිකල්ස් ” ආයතනයට ගෙවීම් කිරිම සඳහා ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා විසින් ස්ථිර කරන ලදි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ටෙන්ඩර් කැඳවලා ඒ අනුව අවම මිල ගණන් තියෙන ආයතනයෙන් මිලදී ගෙන තියෙනවා. ටෙන්ඩර් වාර්තාවත් තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා</u>

අවුරුද්දටම අදාලවද ගන්නේ?

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ඔව්. අවුරුද්දට අදාලව.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

විජී පහන් අළුතින් සවි කිරිම සම්බන්ධව විගණක විමසුමක් තියෙනවා නේද? ඒ විගණක විමසුම සභාවට ආවේ නැනේ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

කොයි කාල වකවානුවක එකක්ද?

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

අළුත් විගණක විමසුමක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

ඒවා සභාවට දෙන්න එපෑ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

කොයි කාල වකවානුවක එකක්ද?

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

මට මතක ටෙන්ඩර් කමිටු වාර්තාවේ වාගේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

මේකේ තියෙන්නේ නම් , විජී පහන් අළුතින් සවි කරපුවට ගත්ත ඒවා නෙමෙ. අළුත් වැඩියා නඩත්තු වලට ගත්තු ඒවා. මේක ඒකට අදාල වෙන්නේ නෑ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

මේක නඩත්තුවට ගත්තු එකක්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා</u>

මේ උපකරණ අරන්ද තියෙන්නේ?

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ඔව් අරන් තියෙන්නේ. ටෙන්ඩර් කැඳවලා , අවම මිල ගණන් තියෙන ආයතන වලින් මිල කැඳවලා, තාක්ෂණික කමිටුවට දාලා , නියම procedure එකට තමා අරන් තියෙන්නේ. හදිසි මිල ගණන් හෙම කැඳවලා ගත්තේ නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

භාවිතාවේ තමයි ප්‍රශ්න තියෙන්නේ.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, 2023 වර්ෂයට විජී පහන් නඩත්තුව සඳහා විජී පහන් උපාංග මිලයට ගැනීමට අදාලව රු.967,000.00 ක් " මහ වැව මිෂෙලි ඉලෙක්ට්‍රිකල්ස් ” ආයතනයට ගෙවීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඉ - 14

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ RS 1796 බැකෝ රථය සඳහා ටයර් 04 ක් මිලයට ගැනීමට අදාලව ගෙවීම් කිරීමට ඇති රු. 638,000.00 ක මුදල පෙරේරා ටයර් හවුස් මාළඹේ ආයතනයට ගෙවීම් කිරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

මේකේ ටෙන්ඩර් කැඳවලා ගත්තේ. මිල ගණන් 03 ක් කැඳවලා හෙම නෙමෙයි. මාස ගාණක් ගියා මේ ටයර් ටික ගෙන්නා ගන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා

මොන විදියට ගත්තත් අපිට වැඩක් කර ගන්න හම්බ වෙන්නේ නැනේ. ටයර් දාන එක හොඳයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

ගරු සභාපතිතුමනි, ටයර් දාන්න ඕනි තමා. රථ වාහන සම්බන්ධ කමිටුවකින් හොයලා බැලුවාද?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

තාක්ෂණ කමිටුවට දාලා , සියළුම දේවල් කලා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

ඒ ටයර් වල mark එකක්වත් දාන්න වෙයි. ආයි පරණ ටයර්ම එයි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.කී.කේ කරුණාරත්න මහතා

ටයර් වල අංක තියෙනවානේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

එහෙනම් මයිලෝ මීටරේකුත් තිබුනේ. මයිලෝ මීටරේ කි.මී 17000 ක් යනකල් කවුරුවත් බලලා තිබුනේ නැනේ. ඕවා බලන් නෑ කවුරුවත්. මයිලෝ මීටරේ pf එකේ හොඳට දුවනවානේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

විගණන විමසුම් වල තියෙනවා. ඒ පිළිබඳ විශ්වාස කරන්නත් අමාරුයි. මේ මහජන මුදල්නේ වියදම් කරන්නේ.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

වාහනේ දුවන් නැතුවත් මීටරේ දුවන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

වාහනේ දුවන් නැතිව මයිලෝ මීටරේ දුවලලු. කි.මී 17000 ක් කියන්නේ පොඩි ගාණක්ද?

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

වාහනේ දුවන් නැතිව මීටරේ ලක්ෂ ගාණකින් දුවලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම් ෂිහාම් මහතා</u>

වාහනේ දුවන් නැතිව, මීටරේත් දුවලා, ඩීසලුත් ගිහිල්ලා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා</u>

මේ කටයුතු ගැන හොයලා නම් බලන්න වෙයි. නැත්නම් මේ ටයර් ටිකත් නැති වෙයි. බැටරි වගේ තමා මේවත්.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

සභාපතිතුමා, මේ ගැන හිතන්න ඕනි. මේ බැකෝ යන්ත්‍ර ගැන කථා කරනකොට ඔය ප්‍රශ්න එන්නේ. බැකෝ යන්ත්‍ර අළුත් වැඩියාවද, ටයර් දැම්මද මේවා සභාවේ මන්ත්‍රීවරුන්ට තියෙන ප්‍රශ්න. ඔයිට ඉස්සෙල්ලත් කථා වුනා. දවසක් , දෙක්ක ගියාම කැඩුනා කියනවා.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා</u>

අවුරුදු කීයකින්ද ටයර් සාමාන්‍යයෙන් මාරු කරන්නේ?

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

කිලෝ මීටර් ගාණට දාන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

ඊළඟට කියන්නේ එක තැන තිබිලා දිරලා කියලා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

පහුගිය කලේ මාස 07 ක් විතර එක තැන තිබුනනේ. පහුගිය නිලධාරින්ගේ හොඳකම. RS 1796 මාස 07 ක් එක තැන තිබුනා. මං පත් වුනාට පස්සේ සතියෙන් ඕක හදලා ගත්තා.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

ඔය JCB එක කැඩිලා , ඒක හදලා. අවසානයේ ගෙවීම් කරන්න මහා සභාවට දැම්මම ගෙවීම් කරන්න නිර්දේශ තිබුනේ නෑ.

( කිහිප දෙනෙක් එකවර කරුණු දක්වන නිසා පවසන දේවල් පැහැදිලි නැත. )

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ලක්ෂ පහයි ගාණක් වියදම් කරලා හදලා, වාහනේ හදන්න බෑ. මාස 07 ක් විතර එක තැන තිබ්බා.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

එක කොටසක් හැදුවා. වාහනේ, කිච්චම එකම නෙවෙයි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

සභාපතිතුමා, ටයර් වල අංක තියෙනවා. මේ ආයතනයේ කවුරු හරි ඒවා ලියා ගත් නැද්ද?

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

පැහැදිලිවම, ඒවා ඔක්කොම ලියා ගත්තා. ගලවා ඉවත් කරපු ටයර් එකත්, අළුතෙන් ගෙනල්ලා දාපු ටයර් එකෙත් අංක ලියලා විෂය භාර නිලධාරියි, ලේකම්තුමයි , C C මහත්තයයි තුන් දෙනාම ඉස්සරහා ඒ කටයුතු ටික කලා.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

**252** ටයර් **04** ම නැතුව තිබ්බේ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

පහුගිය කාලේ වෙච්ච සිද්ධි වලට මට වග කියන්න බෑ. මම ඉන්න කාලේ මම මේවා නිවැරදිව කරනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජු නවරත්න මහතා

මං ඉන්න කාලේ නිවැරදිව කරනවා කියලා , මෙහෙම මන්ත්‍රීවරුන්ගෙන් අනුමත කර ගෙන කරන්න පුළුවන් තමයි. අපිත් අභියෝග තියෙන කාලෙනේ කලේ. මං ඉන්න කාලේ කරනකොට අපිට තිබ්බේ මේකේ අනිත් පැත්තනේ. කවුරුත් මෙතන වාඩි වෙන පුද්ගලයා නිලතලේ සාධාරණය ඉෂ්ට කරන මනුස්සයෙක්.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

පහුගිය කාලේ වෙච්ච සිදුවීම් වලට මට වග කියන්න බෑනේ ගරු මන්ත්‍රීතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජු නවරත්න මහතා

පහුගිය කාලේ ඒවා නෙමෙයි දැන් මෙතන කථා කලේ ටයර් ගැනනේ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

ඒක තමා මං ඒක නිවැරදිව කලා කිව්වේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යරත්න මහතා

ඒ විගණන වාර්තා වලට නිවැරදිව උත්තර දීලා , ඒවා නිවැරදිව ක්‍රියාත්මක වෙන්න ඕනි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ **RS 1796** බැකෝ රථය සඳහා ටයර් **04** ක් මිලයට ගැනීමට අදාලව ගෙවීම් කිරීමට ඇති රු. **638,000.00** ක මුදල පෙරේරා ටයර් හවුස් මාළඹේ ආයතනයට ගෙවීම් කිරීමට කටයුතු කිරීම අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 15**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් රන්වැලි සංකීර්ණයෙහි පිහිටි අංක **15** කඩ කාමරය සඳහා මාසික කුලිය රු. **5000.00** ක් ලෙස තක්සේරු කර තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක **KE / RP / 1919** හා **2017.09.22** දිනැති ලිපිය අනුව **2017** නොවැම්බර් මස සිට නව ගාස්තු අය කිරීමට බදුකරුවන් දැනුවත් කලද , සබරගමුව පලාත් පාලන කොමසාරිස්ගේ අංක **CLG / 5 / 2 / 1 / 25** හා **2018.05.12** දිනැති ලිපිය මගින් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නව තක්සේරු මුදල සංශෝධනය කරන තෙක් දැනට සංශෝධිත නව කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කරන ලෙසයි. මේ අනුව **2017** නොවැම්බර් මස සිට **2018** මැයි දක්වා නව ගාස්තු යටතේ අය වීමට ඇති හිග මුදල රු. **24, 610.00** ට අදාලව අධි ගාස්තුව රු. **135,250.00** ක මුදල කපා හැරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතිය ලබා ගැනීමටත්, ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීම සඳහාත් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි. ( රු. **24,610.00** ක කුලී මුදල ගෙවා ඇත )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

මේ යෝජනාව පැහැදිලි කර ගන්න අවශ්‍යයි.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.සී.ඒ අධිකාරි මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.එන්.පී ජයතිලක මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

2017 නොවැම්බර් මස සිට 2018 මැයි දක්වා නව ගාස්තු යටතේ අය වීමට ඇති හිග මුදල රු. 24, 610.00 ට අදාලව අධි ගාස්තුව රු. 135,250.00 ක මුදල කපා හැරීමත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමත් සුදුසුය යන ප්‍රකාශය සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් රන්වැලි සංකීර්ණයෙහි පිහිටි අංක 15 කඩ කාමරය සඳහා මාසික කුලිය රු. 5000.00 ක් ලෙස තක්සේරු කර තක්සේරු දෙපාර්තමේන්තුවේ අංක KE / RP / 1919 හා 2017.09.22 දිනැති ලිපිය අනුව 2017 නොවැම්බර් මස සිට නව ගාස්තු අය කිරීමට බදුකරුවන් දැනුවත් කලද , සබරගමුව පලාත් පාලන කොමසාරිස්ගේ අංක CLG / 5 / 2 / 1 / 25 හා 2018.05.12 දිනැති ලිපිය මගින් තක්සේරු දෙපාර්තමේන්තුව මගින් නව තක්සේරු මුදල සංශෝධනය කරන තෙක් දැනට සංශෝධිත නව කුලී මුදල් අය කර ගැනීමට කටයුතු කරන ලෙස දන්වා ඇත. මේ අනුව 2017 නොවැම්බර් මස සිට 2018 මැයි දක්වා නව ගාස්තු යටතේ අය වීමට ඇති හිග මුදල රු. 24, 610.00 ට අදාලව අධි ගාස්තුව රු. 135,250.00 ක මුදල කපා හැරීමත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතියට යොමු කිරීමත් අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 16</u>

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් රුවන්වැල්ල පොදු වෙළඳපල කඩ හිමියන් විසින් 2023.02.07 වන දින කරනු ලබන ඉල්ලීමට අනුව ඔවුන් විසින් මෙම කඩ වල කුලී මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා ඇති අතර, ආර්ථික අපහසුතා හේතුවෙන් හිග දඩ මුදල ගෙවීමට හැකියාවක් නොමැති බැවින්, එම දඩ මුදල් අය කිරීම ඉවත් කර දෙන ලෙස ඉල්ලීම් කර ඇත. එබැවින්, මෙයට අදාල රු. 2,005,175.00 ක දඩ මුදල කපා හැරීම සඳහා ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි. ( ඇමුණුම 04 කඩ හිමියන් සම්බන්ධව දක්වා ඇත )

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

කලින් සහන දීලා තියෙන හින්දා ඒක අනුමත කරන්න අමාරුයි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

09 වෙනි යෝජනාවේදි කථා කලා වගේ, මේක අනුමත කරන් නෑ නේද?

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

කොහොමත් මේක අනුමත කරන්නේ නෑ කියන තැනට නේ ආවේ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ඔව්. ප්‍රතික්ෂේප කරනවා නේද?

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවට අයත් රුවන්වැල්ල පොදු වෙළඳපල කඩ හිමියන් විසින් 2023.02.07 වන දින කරනු ලබන ඉල්ලීමට අනුව ඔවුන් විසින් මෙම කඩ වල කුලී මුදල් සම්පූර්ණයෙන්ම ගෙවා ඇති අතර, ආර්ථික අපහසුතා හේතුවෙන් හිග දඩ මුදල ගෙවීමට හැකියාවක් නොමැති බැවින්, එම දඩ මුදල වන රු. 2,005,175.00 ක මුදල කපා හරින ලෙස කරන ලද ඉල්ලීම ඒකමතිකව ප්‍රතික්ෂේප වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ඉ - 17</u>

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව සතු ඉඩම් මැන පිඹුරු පත් සකස් කිරීමටත් , මිනින්දෝරු ගාස්තු ගෙවීමටත් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

මේවා අපි කල යුතු දේවල්. නමුත්, අපි මේවගේ එකක් පහුගිය කාලේ කලා. මම දන් නෑ ගෙවීම් කලාද කියලා. කරවනැල්ල පාලම උඩ නැරඹුම් මැදිරියක් හදන්න මිනින්දෝරු ගාස්තු ගෙවන්න අපි අනුමැතියක් දුන්නා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

මේ සභාව සතු ඉඩම්.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

සභාව සතු ඉඩම්. ඒක හරි. මං මේකට පරිබාහිරව කථා කරන්නේ. ඒකට වුනේ මොකක්ද කියලත් මං අහනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.එස් ආනන්ද පෙරේරා මහතා</u>

මේ යෝජනාවට මාත් කාරණාවක් එකතු කරන්න ඕනි. මේ යෝජනාව මීට වඩා විධිමත් වෙන්න ඕනි. සභාවේ ඉඩම් වල නම් තියෙනවනේ. මහ වත්ත , ගෙදර වත්ත කියලා. එතකොට මන්ත්‍රීවරු දැනුවත් වෙනවා , සභාවේ ඉඩමක් තමා මනින්නේ කියලා. අන්තිමට මනින්නේ වෙන කොහේවත් තියන ඒවා. බිල් ගෙවන්න වෙන්නේ සභාවෙන්. දැඩිව විරුද්ධ වෙලා පහුගිය කාලේ එහා පැත්තේ ඉඩමක් මනින එක යන්තන් වැලකුනා. නැත්නම් සභාවෙන් නිකන් මුදල් ගෙවනවා. කිසිම ප්‍රතිලාභයක් සභාවට ලැබෙන්නේ නෑ. මේකේ සභාව සතු දේපල හඳුනා ගැනීම වැදගත්. ඒ ගැන මන්ත්‍රීවරුන් දැනුවත් වීම වැදගත්. වසමකට අයිති ඉඩම් තියෙනවා බොහෝ තැන් වල. මැනපුවත් තියෙනවා. ඒ නිසා සඳහනක් එක්ක මේක ඉදිරිපත් කලා නම් වටිනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

මේකේ සියළු ඉඩම් මනිනවද?

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.එස් ආනන්ද පෙරේරා මහතා</u>

මැනපුව තියෙනවා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

අඟුරුවැල්ල ගත්තොත්, ඒ අගුරුවැල්ලේ ඉඩම මීට කලින් මැනලා තියෙනවා. ඒකත් මේ අනුව ආයේ මනිනවද? මාකට් එක තියෙන භූමිය මිනුම් කරන්න කියලා රජයෙනුත් ඉල්ලුවා. ඒකත් මනිනවද? ප්‍රශ්නයක් තියෙනවානේ. ඒකට මුදල් බැඳලා තියෙනවා. මිනුම් කටයුතු කිව්වාම , දැනට මැනලා නිරවුල් කරලා නැති සියළු ඉඩම් කියලාවත් මෙතන තිබුනා නම් හොඳයි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

මේකේ පරමාර්ථය මොකක්ද? මේ වෙනකොට ඉඩම් ගොඩක් මැනලා. ඊගාව යෝජනාවේ ප්‍රාදේශීය ලේකම්තුමාට අත්පත් කර ගැනීමට අපි සල්ලි බැඳලා තියෙනවා. ඒකෙනුත් ආපහු මනිනවද? හඳුනා නොගත් , මෙන්න මේ ඉඩම් කියලා නිර්ණායකයක් තියෙන්න ඕනි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ඉ - 17 යෝජනාව ලබන සභා වාරයට කල් තබමු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

ප්‍රාදේශීය සභාව සතු ඉඩම් කිව්වාම, සතු සියළුම ඉඩම්නේ. මේ ඔක්කොම ආපහු මනිනවද? එහෙම වුනොත් ඒකට කොච්චර මුදලක් යනවද?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

මේක ලබන සභා වාරයට කල් තබනවා.

මෙම යෝජනාව ලබන සභා වාරයට කල් තැබීම සුදුසුය යන ප්‍රකාශය සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, මෙම යෝජනාව ලබන සභා වාරයට කල් තැබීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

**ඉ - 18**

රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව හා එම්.ඒ.කේ.ඩබ්.බී.එම්.ආර් මෝහිනී නීල් කාන්තා එක්නැලිගොඩ මිය සමඟ රුවන්වැල්ල නගරය , මහවත්ත ඉඩම අංක 3 කොටස යනුවෙන් සඳහන් පර්චස් 23.75 සඳහා පැවති 197 / L දරණ නඩුව රුවන්වැල්ල දිසා අධිකරණයේ 2013.10.22 කෑගල්ල පළාත් බද සිවිල් අභියාචනාකරණය නඩු 24 / 2014 / LA 2013.11.28 හා SC/ HC / CALA 112 / 2016 දරන ශ්‍රේෂ්ඨාධිකරණ නඩු තීන්දු වලින් පසු මෙම ඉඩමේ පර්චස් 9.85 ක් විකුණා ඇත. එම පර්චස් 9.85 ට අදාල අංක 1514 ඔප්පුව හා අංක 1450 දරන පිඹුර අනුමැතිය සඳහා ඉදිරිපත් කර ඇත. මෙම පිඹුර අනුමත කිරීම සම්බන්ධයෙන් 2020.07.16 පැවති මහා සභාවටද යෝජනාවක් ඉදිරිපත් කල අතර, ප්‍රාදේශීය ලේකම්තුමා හරහා මැනුමක් කිරීම හා එහි කටයුතු අවසන් වන තුරු අනුමත නොකරන ලෙස තීරණය කරන ලදි.

නමුත්, මේ වන විට එම ඉඩම මිලදී ගෙන ඇති ඩබ්.ඩබ් හේමලතා මහත්මිය රුවන්වැල්ල ප්‍රාදේශීය සභාව ද්වේශ සහගත ලෙස තම මිනින්දෝරු සැලැස්ම අනුමත නොකර සිටීම සම්බන්ධ නඩුවක් ගොනු කර ඇත. මේ සම්බන්ධ ගරු සභාපතිතුමා හා ලේකම්තුමාගේ අදහසට අනුව මෙය ප්‍රාදේශීය සභාව ගැටළු සහගත තත්වයකට මුහුණ පෑමට සිදු වන ප්‍රශ්නයක් බවයි. එබැවින්, මෙම මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම පිලිබඳ සුදුසු තීරණයක් ගැනීම සඳහා ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

මේ යෝජනාව සම්බන්ධව අදහස් දැක්වීමක් කරන්න වෙනවා. මේකේ නඩුවක් දාලා තියෙනවනේ. රත්නපාල සභාපතිතුමා ඉන්න කාලේ මේ සම්බන්ධව යෝජනාවක් ආවා නේද? ඩූ ෆැන් එකෙන් අපිට නඩු පැවරුවා නේද? මේක ප්‍රාදේශීය ලේකම්තුමාට මිනුම් කරන්න ඉල්ලීමක් කරපු නිසානේ අපි ඒක අනුමත නොකලේ. ප්‍රාදේශිය ලේකම්තුමා ඒ මිනුම දීලත් නෑ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

නෑ දීලා නෑ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

දැන් සභාවෙන් නඩුවට යන්න වෙනවා. නඩුව මැයි මාසේ නේද?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

නඩුවේ අවසාන කොටස යන්නේ. පහුගිය මාසේ වෙනකල් සභාවෙන් මේ සම්බන්ධව කිසි කටයුත්තක් වෙලා නෑ. Lawyer කෙනෙක් අල්ලලාවත් නෑ. ඊට පස්සේ වන්දි ගෙවන්න එනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

මේකට ඉක්මන් තීරණයකට යන්න වෙනවා. ප්‍රාදේශිය ලේකම්තුමාට මේකට මැදිහත් වෙන්න කියලා දැනුවත් කරන්න.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

මේ සම්බන්ධව කථා කරන අපේ නීතිඥතුමා මේ නඩුව පිලිබඳව අධ්‍යයනය කරලා තියෙනවා. එතුමා කියනවා මේ නඩුව අපිට අවාසි සහගතයි කියනවා. අධිකරණ 03 කින් දුන් තීන්දුවක් තමයි අපි මේ අභියෝගයට ලක් කරලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

සමථ තීන්දුවක් ඇවිල්ලා තියෙන්නේ , ප්‍රාදේශිය සභාව අවශ්‍ය කරන ලිපි ලේඛන ඉදිරිපත් කලේ නෑ කියලා. පැමිණිලි පාර්ශවය නීල් ඩයස් මහත්තයා. එතුමාට අයිතිය හිමි වන විදියට තමයි සමථ තීන්දුව යන්නේ. එතුමාට ඇති වෙච්ච අයිතිය එතුමා තව කාට හරි විකුණුවා. ඒ ගත්තු අය විසින් තමයි අපෙන් ඉල්ලා හිටියේ. අපි ඒක දෙන්න බැහැ කියලා කරුණු කාරණා එක්කලා දැම්මේ නඩුව ගොනු කර ගන්න පුළුවන් වෙයි කියලා. ඒක කරන්න නම් ප්‍රාදේශීය ලේකම්තුමා මේකට මැදිහත් විය යුතුයි. ප්‍රාදේශීය ලේකම්තුමා මේකට මැදිහත් වෙන්නේ නැත්තේ ඇයි කියලා මම නම් දන්නේ නෑ. රුවන්වැල්ල පොදු වෙළඳ සංකීර්ණය ඇති කලේ පී.සී ඉඹුලාන මැතිතුමා ඉන්න කාලේ. ඔය මාකට් එක හදන්න ඉඩම් පවරා ගද්දි  තිබුනු ඉඩම් වල පිඹුරු, ඔප්පු කෝ? ඒවා තියෙන්න එපෑ. මාකට් එක ප්‍රාදේශීය සභාවෙනේ. ප්‍රාදේශීය සභාවේ භූමිය සම්බන්ධව ලිපි ලේඛන අපි ළඟ නැද්ද? අපි ඒවා හොයන්න ඕනි ඉස්සෙල්ල. ඒ ටික අරන් බලන්න ඕනි මේ ඉඩම් කොටස ඇතුලත්ව තියෙනවද කියලා. මං හිතන විදියට ඔය ටික පවරා ගන්න එකට , ඔය කොටස සම්පූර්ණ නම් , ඔය කොටසින් භාගයක්වත් අයිති වෙලා තියෙන්න ඕනි. එදා හිටපු වෙළඳ ව්‍යාපාරික හීන් මහත්තමාගෙ පුතා මොරේ මහත්මාගේ ඉඩම්නෙ ඕවා. ඒ අය ඉඩම් අත ඇරලා ගියේ පවරා ගත්ත නිසානේ. යම් කිසි ඉතුරුවක් තියෙන්න පුළුවන්. වෙළඳ සංගමයට පවරා ගැනීමේදි අපි කොපමණ ප්‍රමාණයක් ගත්තද කියලා අපි හොයන්න ඕනි. ඒවා සභාවේ නැති වෙන්න හේතුවක් නැනේ. පවරා ගැනීමේ බලය තියෙන්නේ ප්‍රාදේශීය ලේකම්තුමාටනේ. වහාම එතුමා මැදිහත් කර ගන්න. පවරා ගැනීමේ බලයත් එක්ක අපිට ගත්තේ කොහොමද? මාකට් එක හදන්න ගත්ත ඉඩම් මොනවද? අපි ළඟ තියෙන ලිපි ලේඛන මොනවද? එහෙම නැත්නම් , මේ නඩුවට අවශ්‍ය තව පවරා ගැනීමක් තියෙනවා නම් , වහාම ප්‍රාදේශීය ලේකම්තුමාට යොමු කරලා මේ නඩුව ජයග්‍රහණය කල යුතුමයි. අපරාධයක් මේ ඉඩමට වෙන්නේ. මොන තැනක හරි වැරදීමක් වෙලා තියෙනවා. කවුරු හරි අත යටින් මේකට උදවු කරලා තියෙනවා. ඒ නිසා තමයි මේ නඩුව සමථ වෙන්න සිද්ධ වුනේ. මේකේ ඇත්තටම නිලධාරින්ට ලොකු වගකීමක් තියෙනවා. ලේකම්තුමාට ලොකු වගකීමක් තියෙනවා. මේකට පැහැදිලිව මැදිහත් වෙන්න. අද වන විට කිසිම දෙයක් සභාව වෙනුවෙන් නීතිඥ මහත්තුරුන්ට ඉදිරිපත් වෙලා නෑ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ගරු මන්ත්‍රීතුමා අද වන විට නීතිඥ මහත්තුරුන්ට සියළුම තොරතුරු ඉදිරිපත් කරලා තියෙනවා. අපි නීතිඥ මහත්තයෙක්වත් අල්ලලා තිබුනේ නෑ.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

අපි නීතිඥ කෙනෙක් අල්ලලා තිබුනා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

කොළඹ දාලා තියෙන නඩුව සම්බන්ධව. Plan එක අනුමත කරන් නෑ කියන එකට.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

ඔය නඩුව සම්බන්ධව මැණුම් කටයුතු කරන්න සල්ලි බැන්දේ මං හිටපු වකවානුවේ. මැණුම් කටයුතු කරද්දි විරෝධතාවයකුත් ආවා. ඔය ඉඩම දැන් නීල් ඩයස් මහත්තයාට විකුණලා තියෙනවානේ. විකුණලා තියෙන්නේ " ඩූ ෆැන් " ආයතනයට. ඒ අය අපි ගාවට ආවා , ඇයි මේ Plan එක අනුමත කරලා දෙන් නැත්තේ අහන්න. මම ඉන්න යුගයේ ඕක සභාවට දැම්මා. එහෙම ආවාම මම කිව්වේ, සභාව සතු භූමියක තියෙන අයිතිය , අපේ නිලධාරින් හිතා මතා මඟ ඇරලා තියෙනවා. ඒ නිසා සභාවට ලොකු ආදායම් අහිමි වීමක් තියෙනවා. ඒ නිසා මේක නැවත යාවත් කාලීන කරන්න ඕනි. ඉඩමට ඇතුල් වෙන්න නම් , ප්‍රාදේශිය ලේකම්තුමාට ඉඩම් බලතල තියෙනවා. එතුමා මේකට යොමු කරන්න ඕනි නිසා තමයි, සභාපතිවරයා හැටියට අපි ඉල්ලීම කලේ , මේකේ මැණුම කරන්න කියලා. මැණුම කරා. එතනින් එහාට මේකේ ගමන ගියේ නෑ. මම ඉන්න කාලේ , ඔබතුමා කරා කිව්වාට, මේ නඩුවට මම ඉන්න කාලේ appeal සල්ලි බැන්දේ. ප්‍රාදේශීය ලේකම්වරයා දැනුවත් කිරීම සභාපතිවරයා හැටියට ඔබතුමාගේ වගකීමක්. ප්‍රාදේශිය ලේකම්තුමා තමයි දැන් මේක ක්‍රියාත්මක කරන්න ඕනි. නඩුවට අවශ්‍ය ලේඛන අපි සපයලා , නඩුව කර ගෙන යන්නයි දැන් මේකේ තියෙන්නේ. මේ යෝජනාවට අපි අනුමැතියක් දෙනවද නැද්ද කියන එක නෙමෙයි අපි කරන්න ඕනි. නැවත lawyer කෙනෙක් අල්ලලා , එයාට මේ නඩු කටයුත්ත කියලා , මේකේ දෙයක් තියෙනවා නම් ඒක අත්පත් කර ගැනීම කරන්න තියෙන්නේ.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

ගරු සභාපතිතුමනි, මෙතන ප්‍රශ්න 02 ක් තියෙනවා. මේ නඩු කටයුත්තකට ගිහිල්ලා තියෙන්නේ. සැලැස්ම අනුමත කර ගැනීම පිලිබඳ ප්‍රශ්නයක්. ඉඩම් නඩුව පිලිබඳව දැන් ඉවරයි.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

දැන් නඩුව අපි පරාදයි.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

අපි පරාදයි.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.එච්.එම්.පී.ඩී වෛද්‍යාරත්න මහතා</u>

ඒක ශ්‍රේෂ්ඨාධිකරණ තීන්දුව.

<u>ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා</u>

සාමාන්‍ය අධිකරණය, ශ්‍රේෂ්ඨාධිකරණය මේ ඔක්කොටම ගිහිල්ලා පරාදයි. නමුත්, එක දෙයක් තියෙනවා, ආනන්ද රූපස් ශ්‍රී කියන මිනින්දෝරු මහත්තයා කහටගස් තැන්නේ. එයා තමයි මේක මැනලා තියෙන්නේ අත් පත් කර ගන්න. මට මතක හැටියට පිඹුරු අංක 314 යටතේ ඕක අත්පත් කරගෙන තියෙන්නේ. ඒ පිඹුර අනුව ඔකෙන් දෙකෙන් පංගුවක් සභාවට අයිතියි. චූලනී කිරි ඇල්ල , එතකොට ඉඹුලාන මහත්තයාගේ ලේකම් තමයි ඔය මැනුම් කටයුත්තෙදි එතන හිටපු කෙනා. එයා පැහැදිලි කරනවා , මෙන්න මේ මායිම වෙනකන් සභාවට සතුයි කියලා. ඊට පස්සේ , මේක තව දුරටත් නිරවුල් කර ගන්න තමයි , කවුරු සල්ලි බැන්දත් කමක් නෑ. ප්‍රාදේශීය ලේකම්තුමාට සල්ලි බැඳලා, මේකේ භුක්තිය සතු කර ගන්න. අත්පත් කර ගත්තා නම්, සභාවට බුක්තිය භාර දෙන්න කිව්වා. භුක්තිය භාර දෙන්න ප්‍රාදේශීය ලේකම්තුමා මැනුමක් කරන්න ඕනි. ඒ මැණුම කරන්න සල්ලි බඳින්න කියලා සභාවට දැනුම් දිලා තිබුනා. සල්ලි බැඳලා , මේකේ මැණුම් කටයුත්තක් කලා. මේ මැණුම් කටයුත්ත කරනකොට එතන " ඩූ ෆැන් " එකේ කට්ටිය විරුද්ධ වුනා. එහෙමම මැණුම නතර වුනා. ප්‍රාදේශිය ලේකම්තුමාගෙන් අහන්න, අපි සල්ලි බැඳලා තියෙනවා. ඒ මැණුමට මොකද වුනේ කියන එක අපි නිශ්චිතව දැන ගන්න ඕනි. ඇයි මේක දැන් නැවතිලා තියෙන්නේ කොතනද? ප්‍රාදේශීය ලේකම්තුමා නීතිපතිතුමාගෙන් උපදෙස් පැතුවද? මොකක් නිසාද මේක නැවතිලා තියෙන්නේ කියන එක ප්‍රාදේශිය ලේකම් කාර්යාලයෙන් අහන්න. මේ ඉඩම් නඩු කටයුත්ත නෙමෙයි මේ. මේකේ ගොඩනැඟිල්ලක් හදන්න Plan එක අනුමත කර ගන්න. ඒ Plan එක ඉදිරිපත් කිරීමේදි අපි විරුද්ධ වෙන්න හේතු වුනේ අර කරුණු ටික. දැන් මේක ඇත්තටම මේ ගොල්ලෝ නාගරික සංවර්ධන අධිකාරියට අභියාචනයක් කරන්න එපැයි. අපි මේක ප්‍රතික්ෂේප කරනවා නම්, ඊළඟට නාගරික සංවර්ධන අධිකාරියට යන්න ඕනි. මේ නඩුවෙදි පාර්ශවකාරයෙක් කර ගන්න ඕනි නාගරික සංවර්ධන අධිකාරිය. නාගරික සංවර්ධන අධිකාරියට පුළුවන්කම තියෙනවා මේක දෙන්නත්, නොදෙන්නත්. අති විශේෂ ගැසට් එකක් ඒක. ඒ අනුව මේ නඩුවට නාගරික සංවර්ධන අධිකාරිය සම්බන්ධ කර ගන්න ඕනි. මම කියන්නේ , මේ Plan එක අපි අනුමත කලේ නැත්නම්, මේ ගොල්ලෝ අභියාචනයක් කරන්න ඕනි. මේ ගොල්ලෝ ඒ අභියාචනයට ගිහිල්ලා නැනේ. කෙලින්ම මහා අධිකරණයට ගිහිල්ලා. එහෙම යන්න බෑ. මේ ගොල්ලො කියන්නේ වෙන කථන්දරයක්නේ. මේ ගොල්ලො නඩුවෙන් දිනුවා. ඒකේ ගෙයක් හදන්න හැදූවා, අපි Plan එක අනුමත කරලා දෙන් නෑ කියලනේ. Plan එක අනුමත කිරීම වෙනම කථන්දරයක්. ඒකට යන ක්‍රමවේදයක් තියෙනවා. කමිටුවක් තියෙනවා. ඒ කමිටුවට නාගරික සංවර්ධන අධිකාරියෙන් නිලධාරියෙක් සහභාගි වෙනවා. නාගරික සංවර්ධන අධිකාරියත් එක්ක කථා කරලා මේ කටයුත්ත කරන්න කියලා අපි සභාපතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා. මේකේ තීන්දුවකට යන්න ප්‍රශ්නයක් නෑ. කාර්මික කමිටුව හරි කැඳවලා තින්දුවක් අරගෙන අවශ්‍ය කටයුතු කරන්න.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

මෙතන ගෙයක් හදන්න වගේ දෙයක් තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

මේක පොඩි පැහැදිලි කිරීමක් කරන්න ඕනි. මේක නීතිමය කාර්යයක්නේ. නිදා සිටීම වෙනුවෙන් අධිකරණය පෙනී නොසිටී කියලා කියනවනේ. ඒ වගේ තමයි. ප්‍රාදේශීය සභාවට ලොකු රෝගයක් තියෙනවා. අපේ ඉඩම් නිරවුල් කර ගන්න අදාල නඩු වලට අවශ්‍ය මැදිහත් වීම් වෙන්නේ නෑ. භූගත කඩ කාමර වලටත් ඕකනේ සිද්ධිය වුනේ. ඒ නියමිත වෙලාවේ , නියමිත ක්‍රියා මාර්ග ගන්නේ නෑ. මේකත් එහෙමයි. මේ නඩුව ශ්‍රේෂ්ඨාධිකරණයට ගිහිල්ලා තියෙනවා. ඒකේ හේතුව මෙහෙමයි. අධිකරණ 03 කට ගිහිල්ලා අභියාචනා වලින් අවසාන අභියාචනයට අපි නියමිත වෙලාවට කරුණු ඉදිරිපත් කලේ නැති නිසා දෙපාර්ශවයේ නීතිඥ මහත්තුරු දෙන්න එකඟ වෙලා තමයි මේ අයිතිය පවරලා තියෙන්නේ නීල් ඩයස් මහත්තයාට. සමථ වෙන්න. අධිකරණයේදි එකඟ වෙලා තියෙනවා. ඇයි අපි උත්තර බැඳලා නැනේ. එතකොට සභාව හැටියට වැරැද්ද අපේ . තමුන්ගේ අයිතිවාසිකම් ඉදිරිපත් කලේ නෑ. ඊට පස්සේ ශ්‍රේෂ්ඨාධිකරණ නියෝගයක් අනුව , ඒ ඉඩමේ හිමිකම මේ රුවන්වැල්ල

උසාවියෙන් පිස්කල් ඇවිල්ලා මැනලා වෙන් කරලා දීලා තියෙනවා. අපි කියමු පර්චස් 11 ක් කියලා. දැන් ඒගොල්ලෝ පර්චස් 11 ක් මැනලා දීලා තියෙනවා. මෙතනදි සභාව හැටියට විරෝධය දැක්වීමක් කරන්න නැතුව ඇති. යම් විදියකට කරුණු ඉදිරිපත් කරනවා නම් අපිට ඒ අවස්ථාවෙදි කරන්න තිබුනා. මාකට් එක එහා පැත්ත සංවර්ධනය කරන පාර දක්වාම මේ ඉඩම තිබිලා තියෙනවා. ඔතන ලොකු පාරක් තිබුනේ නැනේ. හැබැයි දැන් ඒ ඔක්කොම අත ඇරලා , උඩහ තියෙන පිරිසිදු ඉඩමෙන් තමයි මේ මැනලා තියෙන්නේ. ඒ මනින කොට සමහර විට අපේ අයිති කොටසකුත් ඒකට ගිහිල්ලා තියෙනවා. හැබැයි ඒ වෙලාවෙදි මිනුම් කරන කොට අපි කවුරුත් ඉදිරිපත් වෙලා නෑ. අපි නඩු කටයුතු ගැන කථා කරන්න කමිටුවක් පත් කර ගත්තා. කමිටුව එක දවසක් එකතු වුනා. ඊට පස්සේ කමිටු කිසි දෙයක් වැඩක් නෑ. මන්ත්‍රීවරුන්ගේ අදහස් වැඩක් නෑ. සද්ද නැතුව ඔහේ උඩ බලාගෙන ඉන්නවා. කාට හරි අයිති වුනාම ප්‍රශ්න එනවා. නීල් ඩයස් මහත්තයා නීතිඥවරයෙක්. එතුමා දක්ෂ විදියට ඒක වික්කා. විකුණපු අය අධිකරණය මගින් නිරවුල් කරලා දීපු කොටසක් තමා අර ගත්තේ. එයාලා ඒ කොටසේ ගේ හදන්න තමයි අයදුම්පත ඉදිරිපත් කලේ. උප සභාපතිතුමා තමයි එතකොට වැඩ බලමින් සිටියේ. එතුමා මේක ප්‍රතික්ෂේප කලේ නෑ. එතුමා කිව්වා, මේ ඉඩමේ අයිතිය පිලිබඳ මැනුමක් ඉල්ලලා තියෙනවා. ඒ මැනුමේ කටයුතු ඉවර වෙලා අපේ අයිතිය නිරවුල් වෙන තෙක් අපිට මේක ලබා දෙන්න බැහැ කියලා තමා ලිඛිතව එයාට දන්වලා තියෙන්නේ. ඒ අනුව එයා ශ්‍රේෂ්ඨාධිකරණයේ නඩුවක් ගිහිල්ලා තියෙනවා. ඒ නඩුවට මේ වෙනකල් ඉදිරිපත් වෙලා කරුණු දක්වලා නෑ. සභාව හැටියට ඒවට ගිහිල්ලා , හොයලා බලලා කටයුතු කරන්න එපැයි. දැන් නීතිඥ මහත්තයෙක් ඇල්ලුවම නීතිඥ මහත්තයා කියනවා, මේ වගේ මේ වගේ වෙලා තියෙනවා, ඒ නිසා නඩුවට තියෙන හොඳම දේ තමා මේකට අවසරය දෙන එක. ගොඩනැඟිල්ල හදන්න අවසරය දුන්නොත් නඩුව ඉවරයි. නඩු නිමිත්ත ඉවරයිනේ. එතකොට ප්‍රශ්නයක් නෑ කියන එක තමා ඔය උපදේශය දීලා තියෙන්නේ. ඒ උපදේශය අනුව තමා ඔබතුමාලා මේ යෝජනාව ඉදිරිපත් කරලා තියෙන්නේ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

මේ පිලිබඳ අපි රත්නපුරේ නීතිඥ අංශයෙන් උපදෙස් ගත්තා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා</u>

මේ ඔක්කොම වෙන්නේ ප්‍රාදේශීය සභාවේ ක්‍රියාවලියේ තියෙන දුර්වලතාවයන් නිසා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

අඩු පාඩුවක් තමා. පැහැදිලිව ඒක ඇත්ත.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

ඇත්ත. ඔබතුමා කිව්ව එකට මමත් එකඟයි. ප්‍රාදේශීය සභාවේ ලිහිල් භාවය නිසා තමයි අපිට මේ අත් හැරීම වුනේ. ඒ නිසා අදාල නිලධාරි ඒ විදියට කඩිකාවත නොකලා නම් නඩු නිමිත්ත මෙහෙම වෙන්නේ නෑ. එයාල විටින් විට ඉල්ලනවා නම් දෙන්න වෙනවා. නඩු නිමිත්තේ අපි පාර්ශවකරුවෝ විදියට දෙන්න බෑ. අපි යවනවා ලියුමක්. ප්‍රාදේශීය ලේකම්තුමා මේකට වග කියන්න ඕනි. අපි මැනුම් කටයුතු වලට සල්ලි බැඳලා තියෙන නිසා. සභාවට යෝජනාවක් දාලා තේරුමක් නෑ. ප්‍රාදේශීය ලේකම්ගෙන් අහන්න ඕනි. ඒ නිසා මේ යෝජනාව ඉවත් කර ගන්න. වෙනත් සුදුසු ක්‍රියා මාර්ගයක් ගන්න.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ සරත් මහතා</u>

මේකේ ඉන්න නිලධාරින් දැන ගන්න ඕනි තමන්ගේ රාජකාරිය මොකක්ද කියලා.

( කිහිප දෙනෙක් එකවර අදහස් ප්‍රකාශ කරන බැවින්, කරුණු පැහැදිලි නැත.)

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

සම්පූර්ණ ඉඩමක කෑල්ලක්නේ මේක. සම්පූර්ණ එක තියෙද්දි කෑල්ලක් විකුණන්න දෙන්න බෑනේ. ඕන කෙනෙකුට තේරෙනවනේ මේකේ වංචාවක් කලා කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

මේ ඉඩම අපේ.

( කිහිප දෙනෙක් එකවර අදහස් ප්‍රකාශ කරන බැවින්, කරුණු පැහැදිලි නැත.)

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා</u>

ඉඩමේ අයිතිය නෑ හරි මොකක් කිව්වත් අපි උසාවියට උත්තර බදින්න එපෑ. ඇයි මේ අනුමැතිය දුන් නැත්තේ කියලා.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

මේකේ පැහැදිලි කර ගන්න තියෙන එකම දේ නාගරික සංවර්ධන අධිකාරි පනත යටතේ අපිට සම්පූර්ණ බලය තියෙනවා. ඔනෑම ගොඩනැඟිල්ලක් හදන්න දෙනවද නැද්ද කියන තීරණය ගන්න අපිට බලතල තියෙනවා. මේකට ඒ අතරේ කෑගල්ල නාගරික සංවර්ධන අධිකාරියෙන් උපදේශයක් අරගෙන ඒ අනුව නඩු කටයුතු කරන්න වෙනවා. කරුණාරත්න මන්ත්‍රීතුමා කිව්වා වගේ දෙන්න බෑ කියලා නෑ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

" ඩූ ෆැන් " එක අපිට විරුද්ධව plan එක අනුමත කරන් නෑ කියලා නඩුව දාලා තියෙන්නේ 2022 ජනවාරි මාසේ. මේ පසුගිය මාස දෙකකට එහා පැත්ත වෙනකල් නඩුව සම්බන්ධයෙන් කිසි තොරතුරක් නෑ. අඩුම ගානේ lawyer කෙනෙක්වත් අල්ලලා තිබුනේ නෑ. පියරත්න මහත්තයා මේ විෂය භාර ගත්තට පස්සේ තමයි මේ සම්බන්ධ සියළු දේවල් හොයලා බලලා, මාත් එක්ක අවස්ථා ගණනාවකදි කථා කරලා, lawyers ලා සම්බන්ධ කරගෙන කටයුතු කලේ. ගිය 14 වෙනිදා අපි රත්නපුරේ නීති උපදෙස් පතන්න ගියා. මේක කාරක සභා අවස්ථාවකට පත් කරන්න. පියරත්න මහත්තයා කරුණු පැහැදිලි කරයි.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

ඕකේ මූලිකව කොළඹ නන්දසිරි කියලා නීතිඥ මහත්තයෙක්ට භාර දීලා කටයුතු කරලා තිබුනනේ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

ඒ සිදුවීම් මුකුත් වෙලා නෑ ගරු උප සභාපතිතුමා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩබ්.ඒ.එස් ආනන්ද පෙරේරා මහතා

මෙතන මොනවා කථා කලත් , සභා තීන්දුවක් අරගෙන තියෙනවා හතයි දාසය දෙන්න බෑ මේ නඩුව නිසා කියලා. අවුරුදු 02 ක් ගිහිල්ලා file එකක් ඉස්සරහට යන්නේ නෑ කියන්නේ ? ගමක අකුරු දන් නැති මිනිහෙක් වුනත් නඩුවකට සහභාගි වෙන විදිය දන්නවානේ. ඇවිල්ලා මහත්තුරු හම්බ වෙලා ඒකට පියවර ගන්නවා. මේකට ලේඛන දාලා අපි ඉස්සරහට ගියා නම් නඩුව ඉස්සරහට යනවා. තීන්දුව දෙන්නේ පස්සේනේ. අපිට තියෙන අයිතිවාසිකම් සහ මේකට තියෙන බාධක, තියෙන ඒවා ඉදිරිපත් කරන්න ඕනි.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

නිරන්තරයෙන් ප්‍රාදේශීය ලේකම් හරහා විමසීම් කරලා තියෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී පී.ඒ සරත් මහතා

මේකට තාම නීතිඥ මහත්තයෙක් අල්ලලා නැද්ද?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

කාරක සභා අවස්ථාවකට පත් කරන්න කරුණු පැහැදිලි කරන්න.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ සරත් මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරිම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඩබ්.ඩබ් හේමලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම සම්බන්ධව අවශ්‍ය වන නීතිමය උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සභාපතිවරයාට බලය පැවරීම සුදුසුය යන ප්‍රකාශය සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව ,එම ප්‍රකාශය සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රිවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ඩබ්.ඩබ් හේමලතා මහත්මිය විසින් ඉදිරිපත් කර ඇති මිනින්දෝරු සැලැස්ම අනුමත කිරීම සම්බන්ධව අවශ්‍ය වන නීතිමය උපදෙස් ලබා ගෙන ඉදිරි කටයුතු කිරීමට සභාපතිවරයාට බලය පැවරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

සබරගමුව පලාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ඝන අප ද්‍රව්‍ය කලමනාකරණය - 2021 වැඩ සටහන යටතේ අනුමත කර එවන ලද , රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ඉදල්පොල ඝන අප ද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානය දක්වා පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම ( SWS – 2113801 – SP ) ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල රු. 7,900,000.00 ක් හා ගිවිසුම්ගත මුදල රු.7,008,251.84 ක් වේ. නමුත්, වැඩ බිමෙහි කටයුතු කිරීමේදී ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයක් ඉක්මවා සමහර අයිතම වල වැඩ සිදු කිරීමට වූ බවත්, එසේම ස්ථානීය අවශ්‍යතාවය මත අතිරේක වැඩ අයිතම කිහිපයක් සිදු කිරීමට වූ බැවිනුත්, ව්‍යාපෘතිය අංග සම්පූර්ණව නිම කිරීම සඳහා ගිවිසුම් ගත මුදල ඉක්මවා රු. 286,778.10 ක වැඩ වටිනාකම් සිදු කිරීමට වූ බව තාක්ෂණ නිලධාරි විසින් වාර්තා කර ඇත. එබැවින්, එම ගිවිසුම්ගත මුදල ඉක්මවා ඇති වැඩ වටිනාකම වෙනුවෙන් 2021.11.11 දින මහා සභාව මගින් අනුමත කර ඇති අවිනිශ්චිත මුදලින් ගෙවීම් කිරීම සුදුසු බවද පෙන්වා දී ඇත. එබැවින්, අවිනිශ්චිත මුදල රු. 210,247.56 ක් හා ගිවිසුම්ගත මුදලින් ඉතිරි වන රු. 8,251.84 ක් වේ. එම මුදල් වල එකතුව රු. 218,499.40 ක් වන අතර, එම මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීම් කිරීම සුදුසු බවට 2023.02.07 දිනැති ප්‍රසම්පාදන කමිටුවද නිර්දේශ කර ඇත. ඒ අනුව එම මුදල ගෙවීම සඳහා ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා විසින් ස්ථිර කරන ලදි.

මේ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රී මණ්ඩලය අදහස් දක්වන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා</u>

මට නම් මේක සම්මත කරන එක ලොකු ගැටළුවක්.

<u>ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා</u>

මේ සම්බන්ධයෙන් 2021.11.11 දින මහා සභාවේ තීරණයකුත් අරන් තියෙනවා ගරු මන්ත්‍රීතුමා. වැඩිපුර මුදලක් ගිහිල්ලා ඒක ගෙවන්න තමයි මේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.කී.කේ කරුණාරත්න මහතා</u>

මහා සභාවක තීරණයක් තියෙනවා නම් ඇයි ආයේ ගේන්නේ ? වැඩිපුර කොටස ගෙවන්න මහා සභාව තීරණය කලාලු.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.එස්.ආනන්ද පෙරේරා මහතා</u>

මමත් වැඩිපුර ගෙවන එකට මගේ විරුද්ධතාවය ප්‍රකාශ කරනවා. වැඩ ඉවර කරලා මහා සභාවට දාලා මුදල් අනුමත කර ගන්න ඕනි. අපිට එකඟ වෙන්න නම් බෑ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.කී.කේ කරුණාරත්න මහතා</u>

අවිනිශ්චිත මුදලින් ඒක ගෙවන්න කියලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.එස්.ආනන්ද පෙරේරා මහතා</u>

අවිනිශ්චිත තියෙනවා නම් කමක් නෑ. හැත්තෑ නව ලක්ෂයයි කියලා තියෙන්නේ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.කී.කේ කරුණාරත්න මහතා</u>

අවිනිශ්චිත මුදලට අමතරව රු. 8251.84 ක් අමතරව ගෙවන්න ඕනි. අවිනිශ්චිත මුදල ගෙවන්න පුළුවන් නේද රු. 210,247.56 ක්. මේ ගිවිසුම් ගත මුදලට අතරව තව රු. 8,251.84 ක ගාණක් ඉතුරු වෙනවනේ. ඒක වෙනම ගෙවන්න කියලා මේ කියන්නේ. අවිනිශ්චිත මුදලින්ම ඔයා ගාණ ගෙවලා ඉවර කරන්නකෝ.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.එස් ආනන්ද පෙරේරා මහතා</u>

කවුද ඒක ඉල්ලන්නේ? ගිවිසුම්ගත සමිතිය හරි ආයතනය කවුද?

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඒ.ඒ.එන්.පී කරුණාරත්න මහතා

අවුරුදු ගාණක් ගිය එකක් මේ.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

පරණ කුණු මට හෝදන්න වෙලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා

වැඩක් ඉවර වුනාට පස්සේ මාස 03 ක් ඇතුලත ඒ ගෙවීම් කටයුතු කරන්න එපෑ.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

මේවෑ සල්ලි ඇවිල්ලා තිබුන් නෑ. ඒකයි වැඩේ. පෞද්ගලික කොන්ත්‍රාත්කරුවෙක්. නම දාලා නෑ මේකේ.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

සාමාන්‍යයෙන් කර්මාන්ත කරන කොට කරන්නේ දීපු මුදලට කරන එකනේ.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

අපි මේක ඊළඟ සභාවට කල් තියමු.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

සිමෙන්ති මුදල් වැඩි වෙන්න පුළුවන්. එහෙමනේ වැය කර ගන්නේ. ඕක ගෙවනවද, නැද්ද කියලා තින්දුවක් ගන්නකෝ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා

මෙතන හැත්තෑ නව ලක්ෂයක් තමා ඇස්තමේන්තුව. හැත්තෑ ලක්ෂ අට දාහකට තමා ගිවිසුම් ගත වෙලා තියෙන්නේ. එයා ඉල්ලලා තියෙන්නේ හැත්තෑ ලක්ෂ ගාණකට. අවිනිශ්චිත මුදල් තියෙනවා රු. 210,247 ක්. මෙයා ඉල්ලනවා රු. 218,499.40 ක් වැඩිපුර ගියා කියලා. 2021 මහා සභාව තීරණය කරලා තියෙනවා, අමතර වැඩ කරනවට වැඩ වටිනාකම අවිනිශ්චිත මුදලින් ගෙවන්න කියලා. දැන් අට දහස් ගාණයි අඩු. ඔය අට දාස් ගාණ කපලා , අවිනිශ්චිත මුදලින් ඕක අර ගත්තා නම් අපිට කිසි බරක් නෑ. ඒක ඇස්තමේන්තුවේ වෙන් වෙලා තියෙන ගාණක්නේ. අවිනිශ්චිත මුදල. ඒ කාලේ තීන්දුවක් අරන් තියෙනවා. එහෙම කරන්න කියලා මහා සභාවෙන්. නමුත් මේ සල්ලි ගෙවලා නෑ. දැන් තමා සල්ලි ඇවිල්ලා තියෙන්නේ. ඒ සභා සල්ලි නෙවෙයි. පලාත් සභාවේ සල්ලි. දැන් තමයි එයාට ගෙවීම් කරන්නේ. ඒ කාලේම මේ මුදල හම්බ වුනා නම් මේ මනුස්සයාට හොඳයි. අවුරුදු ගාණක් ගිහින් පොලියට සල්ලි හෙම අරන් ඒ මනුස්සයා අමාරුවේ වැටිලා. ඒ මනුස්සයා දැන් ඒ මුදල ඉල්ලනවා. ඒකයි මෙතන තියෙන ප්‍රශ්නය. අට දාස් ගාණයි අමතරව යන්නේ. අවිනිශ්චිත මුදලේ දෙලක්ෂ ගාණක් තියෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

අපි ඕක අනුමත කරමු.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා

කොන්ත්‍රාත්කාරයෝ අසරණ වෙලා තියෙන්නේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ටී.එම් ෂිහාම් මහතා

අසරණ වෙලා නෙමේ.අසරණ කලා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා

ඒ මිනිස්සු දැන් අවුරුදු ගාණක් බලන් ඉන්නවා. පුස්තකාලේ වැඩ කරපු මනුස්සයා හිතන්න. සමහරු තමුන්ගේ යාන වාහන පවා උගස් තියලා සින්න වෙලා. අමාරුවේ ඉන්නේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ආර්.පී සිරිපාල රත්නායක මහතා

සභාපතිතුමනි,මේක අනුමත කරමු. නැත්නම් නොකර ඉමු.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

අවිනිශ්චිත මුදලින් ගෙවීමේ බාධාවක් නෑ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

එහෙනම් අපි ඕක අනුමත කරලා දාලා ඉවරයක් කරමුකෝ.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, සබරගමුව පලාත් සභාවේ ප්‍රධාන අමාත්‍යාංශයේ ඝන අප ද්‍රව්‍ය කලමනාකරණය - 2021 වැඩ සටහන යටතේ අනුමත කර එවන ලද , රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ ඉදල්පොල ඝන අප ද්‍රව්‍ය කලමනාකරණ මධ්‍යස්ථානය දක්වා පිවිසුම් මාර්ගය සංවර්ධනය කිරීම ( SWS – 2113801 – SP ) යන ව්‍යාපෘතිය සඳහා ඇස්තමේන්තු ගත මුදල රු. 7,900,000.00 ක් හා ගිවිසුම්ගත මුදල රු.7,008,251.84 ක් වේ. නමුත්, වැඩ බිමෙහි කටයුතු කිරීමේදි ඇස්තමේන්තු ගත මුදල් ප්‍රමාණයක් ඉක්මවා සමහර අයිතම වල වැඩ සිදු කිරීමට වූ බවත්, එසේම ස්ථානීය අවශ්‍යතාවය මත අතිරේක වැඩ අයිතම කිහිපයක් සිදු කිරීමට වූ බැවිනුත්, ව්‍යාපෘතිය අංග සම්පූර්ණව නිම කිරීම සඳහා ගිවිසුම් ගත මුදල ඉක්මවා රු. 286,778.10 ක වැඩ වටිනාකම් සිදු කිරීමට වූ බව තාක්ෂණ නිලධාරි විසින් වාර්තා කර ඇත. එබැවින්, එම ගිවිසුම්ගත මුදල ඉක්මවා ඇති වැඩ වටිනාකම වෙනුවෙන් 2021.11.11 දින මහා සභාව මගින් අනුමත කර ඇති අවිනිශ්චිත මුදලින් ගෙවීම් කිරීම සුදුසු බවද පෙන්වා දී ඇති බැවින් හා අවිනිශ්චිත මුදල වන රු. 210,247.56 ක් හා ගිවිසුම්ගත මුදලින් ඉතිරි වන රු. 8,251.84 කින් සමන්විත වන රු. 218,499.40 ක මුදල කොන්ත්‍රාත්කරු වෙත ගෙවීමට කටයුතු කිරීම අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපතිතුමාගේ හදිසි යෝජනාව:-

01

ඉ - 20

ඉඹුලාන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට 2023 වර්ෂයේ මුල් කාර්තුව සඳහා අවශ්‍ය වන ඖෂධ ලබා ගැනීමට පළාත් සභා ප්‍රතිපාදන ප්‍රමාද වන බැවින්, ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපාදන සලසා ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය කටයුතු ( ප්‍රවාහන පහසුකම් ) සඳහාත් ගරු මහා සභාවේ අනුමැතියට යෝජනා කරමි.

මෙම යෝජනාව ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මහා සභාවේ අදහස ගරු සභාපතිතුමා විසින් විමසන ලදුව , එම යෝජනාව සම්බන්ධයෙන් කිසිදු මන්ත්‍රීවරයෙක් හෝ මන්ත්‍රීවරියක් විරෝධතාවයක් ඉදිරිපත් නොකල බැවින්, ඉඹුලාන නිදහස් ආයුර්වේද බෙහෙත් ශාලාවට 2023 වර්ෂයේ මුල් කාර්තුව සඳහා අවශ්‍ය වන ඖෂධ ලබා ගැනීමට පළාත් සභා ප්‍රතිපාදන ප්‍රමාද වන බැවින්, ප්‍රාදේශීය සභා අරමුදලින් ප්‍රතිපාදන සලසා ගැනීමටත්, ඒ සඳහා අවශ්‍ය ප්‍රවාහන පහසුකම් සලසා ගැනීමත් අනුමත කිරිම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ඊ.කාරක සභා වාර්තා

ඊ - I

මුදල් හා ප්‍රතිපත්ති කමිටුව

-නැත-

ඊ - II

කාර්මික සේවා කමිටුව

- නැත -

ඊ - III

නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටුව

- නැත -

ඊ - IV

පරිසර හා පහසුකම් කමිටුව

-නැත -

ඊ - V

ප්‍රසම්පාදන කමිටුව

- 2023.01.12 දිනැති ප්‍රසම්පාදන කාරක සභා වාර්තාව, 2023.01.25 දිනැති ප්‍රසම්පාදන කාරක සභා වාර්තාව , 2023.01.27 දිනැති ප්‍රසම්පාදන කාරක සභා වාර්තාව සභා ගත කරන ලදි.

උ.ආදායම් වියදම් වාර්තාව,ලැබීම් ගෙවීම් පිළිබඳ මාසික වාර්තාව,ගෙවීම් වාර්තාව,ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්වය පිලිබඳ වාර්තාව ඉදිරිපත් කිරීම

2023 ජනවාරි මාසික - ඒකාබද්ධ ලැබීම් විශ්ලේෂණය, ඒකාබද්ධ ලැබීම් සාරාංශය, ඒකාබද්ධ ගෙවීම් විශ්ලේෂණයන්, ඒකාබද්ධ ගෙවීම් සාරාංශයන්, ආදායම් අය කිරීමේ ප්‍රගති වාර්තාව හා මූල්‍ය තත්ත්වයන් පිළිබඳ වාර්තාව, ගෙවීම් වාර්තාවන් ඉදිරිපත් කිරීම

1.2023 ජනවාරි මසට අදාල මාසික ගිණුම් වාර්තා ගරු මන්ත්‍රීතුමන්ලාගේ දැනගැනීම සඳහා සභා ගත කරන ලදී.

උ - II

2023.01.31 දිනට රුවන්වැල්ල ප්‍රාදේශීය සභාවේ මූල්‍ය තත්ත්වය ගරු මහා සභාවේ දැන ගැනීම පිණිස ඉදිරිපත් කිරීම

2023.01.31 දිනට මූල්‍ය තත්වය

| බැංකුවේ නම | ගිණුම් අංකය | මුදල රු. ශත |
|---|---|---|
| මහජන බැංකුව, රුවන්වැල්ල | (පොදු ගිණුම) 081-1-001-3-4928744 | 22,290,316.13 |
| මහජන බැංකුව, රුවන්වැල්ල | (සේවක ණය ගිණුම) 081-1-001-7-4928780 | 750,199.87 |

ස්ථාවර තැන්පත්

| | | |
|---|---|---|
| මහජන බැංකුව - රුවන්වැල්ල | | 40000000.00 |
| ප්‍රාදේශීය සංවර්ධන බැංකුව, රුවන්වැල්ල | | 1000000.00 |
| | එකතුව | 65,040,516.00 |

ඌ - 1.නොපැමිණි මන්ත්‍රිවරුන්ගේ නිවාඩු අවසරය

2023.02.16 දින අසනීප නිසා මහා සභාවට නොපැමිණෙන බව දැනුම් දුන් ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි එච්.පී.එස් ආනන්ද මහතාට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා යෝජනා කල අතර, එම යෝජනාව එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින් , එතුමාට නිවාඩු අනුමත කරන ලදි.

ඌ - 11.පසුගිය සභා රැස්වීමේ කටයුතු සම්බන්ධයෙන් වූ ප්‍රගතිය සලකා බැලීම

- සභා ගත කරන ලදි. -

ඌ - 111.මන්ත්‍රිවරුන්ට පවරා ඇති අධික්ෂණ කාර්යයන්හි ප්‍රගතිය දැක්විම

- නැත -

ඌ - 1V.මන්ත්‍රිවරුන්ගේ අදහස් දැක්විම

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රි ආර්.පී. සිරිපාල රත්නායක මහතා

හෙට සභාව විසිරෙව්වත් මේ යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද කියලා මට දැන ගන්න ඕනි.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා
කාරක සභා අවස්ථාවකට පත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

කාරක සභාවේ නෙමේ ඕක මහා සභාවේ කියන එක හොඳයි.

ගරු උප සභාපති කේ.පි. රත්නපාල පීරිස් මහතා

චක්‍ර ලේඛයක් තියෙනවා මේ කටයුතු කරන්න බෑ කියලා. මැතිවරණ කොමසාරිස්වරයා ලිඛිතවම සභාවේ ලේකම්වරයාට කථා කරලා ඇති. මේ කාල සීමාව තුල ඔය වැඩ කටයුතු කරන්න බෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

මේකේ උදාහරණයක් ගත්තොත් මහ මැතිවරණයක් තියෙද්දි වුනත්, මන්ත්‍රීවරුන්ගේ විමධ්‍යගත මුදලින් කරන වැඩ පවා නැවැත්තුවා. ඒක ඡන්ද ප්‍රවර්ධන වැඩක් වෙනවා කියලා. ඒක තමයි තියෙන බාධාව.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී. සිරිපාල රත්නායක මහතා
මෙතන වැඩි හරියක් ඉන්නේ නාම යෝජනා අත්සන් කල අයයි. මේ අයගේ යෝජනා ක්‍රියාත්මක කරන්න පුළුවන්ද?

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා
ඒ ගැටළුව එනවා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී. සිරිපාල රත්නායක මහතා
ක්‍රියාත්මක කරන්න බැරි නම් , මේ යෝජනා දීමේ තේරුමක් නෑ. මම යෝජනාව ලියන්න හදලා ලිව්වේ නෑ.

ගරු උප සභාපති කේ.පි. රත්නපාල පීරිස් මහතා

යෝජනාව දෙන්න පුළුවන්. ප්‍රශ්නයක් නෑ. මැතිවරණ කාල සීමාව තුල ක්‍රියාත්මක කරන්න බෑ.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී. සිරිපාල රත්නායක මහතා
මැතිවරණ කාලෙන් පස්සේ වුනත් කමක් නෑ.මැතිවරණය තව අවුරුදු 02 කට කල් යයිද දන්නෑනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

මැතිවරණය කල් දැම්මොත් ඒක බලපාන්නේ නෑ.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී. සිරිපාල රත්නායක මහතා
බැකෝ එක ඉල්ලලා ලියුම් දීලා තියෙනවා සමිති වලින්. සභාපතිතුමා කියනවා ලේකම්තුමාගෙන් අහන්නලු. ලේකම්තුමා කියනවා මැතිවරණ කොමසාරිස්තුමාගෙන් අහන්න කියලා. පාරකට පස් ටිකක් දා ගන්න වගේ දේවල් අපිට කර ගන්න ඕනි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

කොමසාරිස්තුමා දීලා තියෙන උපදෙසක් ඇතිනේ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

කාරක සභා අවස්ථාවකට පත් කරා නම් මෙතුමාට පැහැදිලි කරන්න පුළුවන්.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී. සිරිපාල රත්නායක මහතා
එතකොට කොමසාරිස්තුමාටම පුළුවන් සභාවේ තියෙන යෝජනා ටිකත් ස්ථිර කරන්න.

ගරු උප සභාපති කේ.පි. රත්නපාල පීරිස් මහතා

මැතිවරණ ප්‍රවර්ධන කටයුත්තක් කියලා , කරන්න පුළුවන් කමක් ලැබෙන් නෑ ඒ චක්‍ර ලේඛය අනුව.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

හදිසි ආපදා කටයුත්තක් වගේ නම් කරන්න පුළුවන්.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

යෝජනා සම්මත කරගෙන, මැතිවරණය කල් ගියොත් කරන්න පුළුවන් වෙයි.

( කිහිප දෙනෙක් අදහස් දක්වන නිසා පැහැදිලි නැත. )

ගරු උප සභාපති කේ.පී. රත්නපාල පීරිස් මහතා

මේකේ ක්‍රමවේද 02 ක් තියෙනවනේ. මේ ආයතන පවත්වාගෙන යන්න තියෙන විශේෂිත දේවල් තියෙනවනේ. ඒවාට ප්‍රශ්නයක් වෙන්නේ නෑ. මැතිවරණ ප්‍රවර්ධන කටයුතු වලට අදාල වන දෙයක් තියෙනවා නම් කරන්න බෑ. චක්‍ර ලේඛය සභාගත කරා නම් හරි.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

එතුමා ලිපියක් සංදේශ, පෙත්සම් වාරයේ සභාගත කිරීමක් කලේ. එහෙම තව තියෙනවා නම් ඉදිරිපත් කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ආර් උපාලි විජේරත්න මහතා

ඒව නෙමේ සභාවෙන් සාමාන්‍යයෙන් කරන දේවල්වත් කරන්නේ නැනේ. බල්බ් එකක් දාන් නෑ. පාරක් සුද්ධ කරන් නෑ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා

මටත් කථා කරන්න හොඳ අවස්ථාවක්. අපිටත් බල්බ් එකක් දා ගන්න විදියක් නෑ. පාරවල් සුද්ධ කර ගන්න විදියක් නෑ. පාරවල් සුද්ධ වෙන් නෑ, ලයිට් දාන්නේ නෑ කියලා අපේ කොට්ඨාශ වලත් ඉල්ලීම් තියෙනවා. සමස්තයක් හැටියට ඒ අවස්ථා ලබා දුන්නොත් හොඳයි. මේක කවදා විසුරුවයිද දන්නෙත් නෑ. මොනව කරත් ආණ්ඩුව මේක ඇදගෙනත් යනවා. මැතිවරණයකුත් තියෙන පාටක් නෑ. අපි වෙන paty වලින් nomination අත්සන් කරලත් තියෙනවා. මොන අසමගිය තුල වුනත් සමගියක් තිබුනනේ. සභාව තුල මොන දේ කරත් , එතනින් එහාට මේක ඇදගෙන ගියේ නැනේ. ඒ නිසා සම වරප්‍රසාද අවශ්‍යයයි. මම ලේකම්තුමාටත් කිව්වා. මැතිවරණයක් ප්‍රකාශ කරලා තියෙන නිසා දෙන්න බෑ. පාරවල් ටික කර ගන්න පුළුවන් වුනොත් ඒක ලොකු දෙයක්. පහුගිය දිනක අපේ ගාමිණි අය්යා ඇවිල්ලා කෑ ගහලා ගියා කිව්වා, වාහනයක් ගන්න බෑ. තනිකර ඉලුක් වලින් පාරම වැහිලා. එවලෙම ලේකම්තුමා පාර සුද්ධ කරන්න යවපු එක ගැන මං ස්තුතිවන්ත වෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.ඒ.එස්.පී. ජයසූරිය මහතා

වරිපණම් ගෙවන සීමාවේ වැඩිපුර ඉන්නේ. (පවසන දේ පැහැදිලි නැත) ලයිට් 05 දානවා අළුතින්. ක්‍රියා විරහිත ඒවා ක්‍රියාත්මක වෙන් නෑ.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී ආර්.පී. සිරිපාල රත්නායක මහතා
ලයිට් දාන්න එපා. පිච්චිච්ච ලයිට් ටික හරි දාන්නකෝ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

ගරු මන්ත්‍රීතුමා, චක්‍ර ලේඛයක් එවලා තියෙනවා. මම පලාත් පාලන කොමසාරිස්තුමාගෙනුත් ඇහුවා. නඩත්තු කටයුතු කිරීමේ ගැටළුවක් නෑ කිව්වා. අපි වරිපණම් සීමාවේ නඩත්තු කටයුතු ඉස්සෙල්ල ක්‍රියාත්මක කරමු. අළුතින් කිසිවක් දාන් නැතුව නඩත්තු කටයුතු විතරක් කරමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ. කරුණාරත්න මහතා

සභාපතිතුමා, පාරවල් වල දෙපැත්තේ කැලට වැව්ලා තියෙන ඒවා සුද්ධ කරවන්න පුළුවන්නේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා

වරිපණම් සීමාව ගැන කථා කලොත් , සරත් මන්ත්‍රීතුමා තමයි පලමුවෙන්ම ඉන්නේ වරිපණම් සීමාවේ ආරම්භයේ කරවනැල්ලේ. දෙකට මම. තුනට අගුරුවැල්ල. කන්නත්තොට. පෙතන්ගොඩ. මේ පැත්තට යනකොට මොරාවත්ත පැත්ත. ප්‍රධාන සීමාව ඕකනේ. මෙතුමා යෝජනා කරනවා, එතුමාගේ පාරවල් වල පිච්චිච්ච එක හරි දාලා දෙන්න කියලා. අපිටත් බල්බ් 05 ක් තියෙනවානේ. බල්බ් නොදැම්මත් අපේ කොට්ඨාශ වල ඒවා repair කරලා දෙන්න. විදුලි අංශයට order එක දෙන එක තියෙන්නේ යන ක්‍රමවේදයට යන්න කියලා. පහුගිය චකවානුවේ, මැතිවරණයක් ප්‍රකාශ කරලා තියෙද්දි අපිට විවිධ ආරංචි ආවා. අපි මෙහෙම කියන්න ගියොත්, ආයේ වර්තමානයේ ගැටුමක් ඇති වෙනවා. ආයේ මෙහෙම කියන්න පටන් ගන්නවා කියලා. අම්තිරිගල පාරවල්

කපනවා. මෝටර් ග්‍රේඩරේ ගෙනිහින් දාගෙන තියෙනවා දවස් තුන හතර. Jcb එක ගෙනිහින් තියෙනවා. මට OIC මහත්තයා කිව්වා මැතිවරණ පැමිණිල්ලක් ඇවිල්ලා තියෙනවා කියලා. විජි පහන් දානවලු. මම දන් නෑ. වරිපණම් සීමාව පටන් ගන්නේ අම්තිරිගලින්ද? කරවනැල්ලෙන්ද? මේක අපිට ඇත්තටම ප්‍රශ්නයක්.මැතිවරණයක් ප්‍රකාශයට පත් කරල තියෙනවා. මැතිවරණ අල්ලස් විදිහට තමයි අපි මේවා දකින්නේ. අපි මේවා කථා කරන්න ගියාම කියන්නේ සභාපතිට ගහනවා කියලා. එහෙම කරන්න අවශ්‍යතාවයක් නෑ. දැන් මැතිවරණයක් ප්‍රකාශයට පත් කරල තියෙන්නේ.කොට්ඨාස වල අයට ඕන අපේක්ෂකයෙක් තෝරගන්න අවස්ථාව දැන් ලැබිලා තියෙන්නේ. මේ අවස්ථාවේ වර්තමාන සභාපතිවරයා එහෙම දෙයක් කලා නම් ඒක වැරදි. මෝටර් ග්‍රේඩරය දවස් දෙක තුනක් එහේ තියාගෙන පාරවල් කපලා සුද්ද කලා නම්, ලයිට් ටික දැම්මා නම් ඒක වැරදි. එහෙ මිනිස්සු අපට කතා කරල කිවුවා. අපිට ඒවා ප්‍රශ්නයක්. සංවර්ධන කටයුතු නැවතිලා. වරිපනම් සීමාව පටන් ගන්නේ අම්තිරිගලින්ද කියලා. මට ආරංචි වෙච්ච දේ මම කිව්වේ. තරහ වෙන්න එපා. හරි නම් හරි කියන්න නැත්නම් නෑ කියන්න. මම චෝදනා එල්ල කරනවා නෙවෙයි. අවස්ථාවේ හැටියට කියන්න වෙනවා. අපිට මුකුත් නෑ. අපි නගර ආශ්‍රිත පුද්ගලයෝ. ඒක කියන්න හොඳ නෑ. ෂිහාම් මන්ත්‍රීතුමා කිව්වනේ, අපි හැමෝම එකයි කියලා. ෂිහාම් මන්ත්‍රීතුමාගේ කොට්ඨාසය ගාවට යනකන් වරිපනම් තියෙනවා. අපි ඔක්කොම වරිපනම් ගෙවන කට්ටිය. වීථි පහන් අපි සියල්ලටම සමසේ ලැබෙන්න ඕනි. ඒ ක්‍රමවේදය ඒ විදිහට යන්න ඕනි. පෞද්ගලිකව ඔබතුමාගේ කොට්ඨාශයට විතරක් කර ගන්නවා නම් ඒක වැරදී කියන එක තමයි මගේ මතය.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ගරු මන්ත්‍රීතුමා, නාම යෝජනා භාර ගත්තේ 18 වෙනිදා. ඊට ඉස්සෙල්ලා මම පාරවල් දෙකක් ගිහිල්ල සුද්ද කලා. ඒක මම පිළිගන්නවා. මමත් ලයිට් 5ක් දාගත්තා. අපේ සිරිපාල මන්ත්‍රීතුමා ඉන්නවා. කරුණාරත්න මන්ත්‍රීතුමා ඉන්නවා. විජේකුමාර මන්ත්‍රීතුමා ඉන්නවා. ඒ මන්ත්‍රීවරුන්ගෙන් අහන්න. වයර් ගන්න සල්ලි නැතුව පෞද්ගලිකව මුදල් යොදලා තමයි මම අරන් දුන්නේ. එහෙම දේවල් මම කලා. ඒ නියමිත කාලයට ටෙන්ඩර් කැඳවලා කර ගන්න කාලයක් තිබුණේ නෑ මන්ත්‍රීතුමා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා</u>

අපි පෞද්ගලිකව සතුටු වෙනවා, ඔබතුමා බල්බ් 5 ක් දාගත්තා නම්. අපිට ආරංචි බල්බ් 40ක් විතර දාගත්තා කියලා. අපි දන්නෑ 40 ද 5ද කියලා. ඔබ තුමා ඒක තීරණය කරන්න. විශේෂයෙන්ම මාවරැල්ලේ එක දිගට බල්බ් 10 ක් විතර දාලා තියෙනවා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

ඒක නිලූකා මන්ත්‍රීතුමියයි,කරුණාරත්න මන්ත්‍රීතුමයි දෙන්නගේ යෝජනාවක් විදිහට ඒ පැත්තට ලයිට් 10 ක් දාලා තියෙනවා. ඒක මට අදාල කරගන්න එපා මන්ත්‍රීතුමා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා</u>

මම මාවරැල්ල කිව්වේ උදාහරණයකට. අපි කියන්නේ ඒ මන්ත්‍රීවරු සුදුසු පරිදි දාගත්තාවේ. මන්ත්‍රීවරයාට ලැබෙන්න තියෙන ටික ඔබතුමා අපිට දෙන්කෝ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

මේ මූලාසනයේ ඉඳගෙන අවස්ථා දෙකකදී මම ඔබතුමාට කිව්වා, මන්ත්‍රීවරුන්ට ලයිට් 5 ගානේ දෙන්න ස්ථාන නම් කරලා දෙන්න කියලා. විදුලි අංශය දන්නේ නැනේ ඔබතුමාට ලයිට් කොතනද සවි කරන්න ඕනි කියලා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා</u>

විදුලි අංශය අපිව සම්බන්ධ කර ගත්තා නම් අපි කියනවා කොතනටද දාන්න ඕනි කියලා.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

අවස්ථා දෙකකදී මම මේ සභාවේ දී කිව්වා.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා</u>

අපි ඔයිට වැඩියත් කිව්වා. වෙලා තියෙන්නේ අපිට දෙන්නේ නෑ නේ.

<u>ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා</u>

දැන් ඉතින් දෙන්න බෑ. මේ මැතිවරණ කාල සීමාවනේ. ඔබ තුමාලට අවස්ථා ගණනාවකදී මම ඒක කිව්වා. ඔබ තුමාලා ක්‍රියාත්මක නොවීම මට ලොකු ගැටළුවක්.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර්. මංජුල නවරත්න මහතා

අපිට දුන් නෑ කියන එකයි අපි කියන්නේ.

ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා

ඔබ තුමාලා එහෙම හිතන්න එපා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී එච්.නයනජිත් පුෂ්ප කුමාර මහතා

ගරු සභාවෙන් අවසරයි. සභාවේ සුභ සාධක සංගමයට ආධාර පිණිස පවත්වන සංගීත ප්‍රසංගය වෙනුවෙන් අපි සුදුසු තීන්දුවක් ගමු. මන්ත්‍රීවරු සියල්ලන්ටද ආරාධනා කරනවා කියලා මට දැන් call එකක් දීලා කිව්වා. පොල් තෙල් පහන දල්වන්න. එතකොට ඒ කටයුතු අපේ සියළුම මන්ත්‍රීවරුන්ගේ දායකත්වයෙන් සිදු කරන්න ඒ අය බලාපොරොත්තු වෙනවා කියලා කිව්වා. මාර්තු 23 පැවැත්වෙනවා කියලා කියන්නේ. ඒකට නිශ්චිත මුදලක් හරි කැමති මුදලක් හරි දෙමු. ඒකට තමන්ගේ මොනවා හරි අදහසක් හරි දක්වලා අනුග්‍රහය දෙමු කියලා ආරාධනා කරනවා.

ගරු ප්‍රදේශීය සභා මන්ත්‍රී පී.ඒ සරත් මහතා

සුභ සාධක සංගමයෙන් කරන එකට අපෙන් ලැබිය යුතු උපකාරය ලැබෙන්නත් ඕනි. ඒකට අපි කට්ටියම තීරණය කරමු. ඒ එක්කම ආරාධනා පත්‍ර ලැබුනට පස්සේ හරි කරමු. දෙන්න පුළුවන් ගාණක් තීරණය කරලා දෙමු. මං ගිය පාරත් මතක් කලා. ගෝණගල්දෙණිය නගරයේ කඩ කාමර ඉදි කිරීම සම්බන්ධව පසුගිය අයවැයේ සම්මත වුනා. දැන් මාස 02 ක් වෙනවා. ගරු සභාපතිතුමනි, මාර්තු 09 වෙනකොට අඩුම ගානේ මූලික අදියරවත් පටන් ගන්නවත් කියලා මම කිව්වා. ටෙන්ඩරේවත් සකස් කරලා නෑ. මේකේ ඉන්න නිලධාරින් එක්ක මොකද්ද කරන්නේ කියලා මම දන්නේ නෑ. ජනවාරි මාසේ දවස් 14 කින් මේ ටෙන්ඩරේ ඉවර කල හැකියි. ලේකම්තුමාගෙන් මම මේ අහන්නේ. ටෙන්ඩරයක් ලැහැස්ති කලාද කියලා. කණගාටුයි මේවා ගැන කථා කරන්න. මේ මොකක්ද කරන වැඩේ. ගිය මාසෙත් මම මතක් කලා. මේක ඉවර වෙන්න කලින් පටන් ගමු කියලා. මේක ඉන්න කෙනෙක් මේක හදයි. ඒක අපේ වත්කමක්. මේකට හම්බෙන ආදායමක්. මේක ඉවර වෙන්න ඉස්සෙල්ල ටෙන්ඩරේ දීලා වැඩේ පටන් ගමු. මේ ආයතනය මොකද්ද කියලා තේරෙන්නේ නෑ. නඩු ගත්තොත්, නඩු දන්න කෙනෙක් නෑ. පිස්සෝ වගේ. උසාවි යනවා. Lawyer දන්නේ නෑ. මෙහෙන් ගිය කෙනෙක් නෑ. නඩුව තීන්දු වෙලා. නඩුවක් තියෙනවා. ඉදිරිපත් වෙන්න කෙනෙක් නෑ. මේක ආයතනයක්. ගෙදරින් ගෙනත් දෙනවා නෙමේනේ. ඒවාට වියදම් කරනවා. මීට වඩා මේ ඉන්න නිලධාරින් කාර්යක්ෂම වෙලා වැඩ කෙරුවා නම්, මේ ප්‍රශ්න මීට වඩා දිග් ගැස්සෙන් නෑ. ඉදිරි සභාවකට එන කෙනෙක්ටවත් හදා ගෙන යන්න පුළුවන් විදියට වෙනවා නම් හොඳයි. යටියන්තොට ලේකම්තුමා හිටියා නම් මේවා මේ තරම් වෙන් නෑ. එහෙනම් මීට වඩා වැඩ කෙරෙනවා. අපි දන්නවා ඒ දවස් ටිකට කරපු වැඩ ටික. කෝටි ගාණක් වෙලා තිබුනු ආදායම් ටික එකතු කරලා තිබුනා. ඒ වගේ නිර්මාණශීලි වෙන්න ඕනි. ඕන අදහස් ටික මෙතනට දුන්නාම මෙතනින් අනුමත කරලා දෙනවානේ. අපි බලා ඉන්නවා කඩ කාමර 02 හදා ගන්න. මේක අනුමත කරලා, මහා සභාවේ තීන්දුවකුත් අරන් අයවැය සම්මත වෙලා දවස් 14 කින් ටෙන්ඩරේ දාන්න තිබුනේ. දැන් මාස 03 ක් වෙනවා. ඒ ගැන මම කණගාටු වෙනවා. මම නැවතත් මතක් කරනවා. සුභ සාධක සංගමයෙන් පවත්වන අරමුදල තර කර ගැනීමට යම් කිසි දායකත්වයක් දෙමු. ඒ ගැනත් පොඩි සාකච්චාවක් කරලා අපි මොකක් හරි කරමු.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

මන්ත්‍රී මාසික දීමනාව ඒක සියළු මන්ත්‍රීවරුන්ට බලපාන එකක්. මන්ත්‍රිවරුන්ගේ දිමනාව දින නියම කර තිබෙන විදිහ වැරදියි. අපේ සභාව ආරම්භ කරපු දවස තියෙනවානේ. 2018 පෙබරවාරි 18 වෙනිදානේ. 18 වෙනිදා සිට ඊළඟ මාසේ 18 වෙනිදාටයි මාසේ සම්පූර්ණ වෙන්නේ. මාසේ 1 දා සිට 31 වෙනිදා නෙවෙයි. අපි එහෙම කරනවා අයවැය හෙම හදනකොට. ගිණුම් සාරාංශය හෙම හදනකොට හෙම. මේකේ වෙන්න ඕනි මට තේරෙන විදියට පෙබරවාරි මාසේ 18 පටන් ගත්තේ. මාසේ සම්පූර්ණ වෙන්නේ ඊළඟ මාසේ 18 වෙනිදට. මේ දිමනාව මන්ත්‍රිවරුන්ට දෙන්න ඕනි.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

( ලේකම්තුමා දක්වමින් ) කාරක සභා අවස්ථාවකට යොමු කරන්න මෙතුමට කරුණු පහදන්න.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා</u>

ගිය සැරේ අයවැයෙන් යෝජනා කරපු ගෝණගල්දෙණිය කඩ කාමර 02. අපේ මන්ත්‍රීවරුත් හොඳට අයවැය සම්මත කරලා සතියෙන් දෙකෙන් මේක පටන් ගන්න පුළුවන් කියලා , අළුත් සභාපතිතුමාගේ වැඩක් කියලා කිව්වා. ගෝණගල්දෙණිය උප නගර වලට සංවර්ධනය කියලා , විච්චූර්ණ ගොඩක් කියලා ඒක සම්මත කලා. දැන් ජේනවනේ තියෙන අභියෝගය. ඒ නිසා මේ කියන හැටියට යෝජනා සම්මත කර ගත්තාට ගොඩනැඟිලි හදන්න බෑ. ඕවට අනුමැතිය ගන්න ලොකු පටිපාටියක් තියෙනවා. මම සතුටු වෙනවා. ගෝණගල්දෙණිය සරත් මන්ත්‍රීතුමා, නිශාන්ත ප්‍රදීප් මන්ත්‍රීතුමා , රාජා හතරසිංහ මන්ත්‍රීතුමා මේ අයගේ උප නගර වලට ලොකු දෙයක් ඔබතුමා ඇවිල්ලා කරා. හොඳ රාජාසන කථාවක් වගේ කරලා , එදා සභාවේ බොහොම පැහැදිලිව කිව්වා අයවැය කථන්දරේ. මේවා කරන්න බෑ. ඇත්ත කථන්දරේ. ඕවට කෝ සල්ලි. මැතිවරණයක් ප්‍රකාශයට පත් වෙලා තියන වෙලාවේ ඕව කොහොමත් කරන්න බෑ. හෙට අත්තිවාරම් දාලා පටන් ගන්න පුළුවන් නම්. කරන්න බෑ. මම කිව්වා බොහොම පැහැදිලිව. අපි ඉඹුලාන පුස්තකාලය, රුවන්වැල්ල පුස්තකාලය හැදුවා වගේ. ඒවා යම් කිසි ක්‍රියාවලියකට ගිහිල්ලා සභාවේ අනුමැතිය අරගෙන කරපුවා. අයවැය යෝජනාවෙන් ගෙනාපු පමණින් ඒවා කරන්න බෑ. අපේ ලක්ෂය, ලක්ෂ 03 දෙන්න තිබුනානේ. තාම අපිට නෑනේ. අපිට ප්‍රශ්නයක් තියෙනවා. ඊයේ පෙරේදා රුවන්වැල්ලේ කඩයකට වෙන් කරපු කොටස ගැන. මට කථා කරන්න කිව්ව නිසා කියන්නේ. වෙළඳ සංගමේ, නාගරික රියදුරු සංගමේ ගාව අර දිසානායක මහත්තයාට වෙන් කරපු කොටස. ඊයේ පෙරේදා එතුමා ඇවිල්ලා , කම්බි කණු හිටවන්න ලැහැස්ති වෙලා තියෙනවලු. අපි සභාවෙන් අනුමැතියක් දුන්නා. එතුමාට විතරයි. ඒකේ ප්‍රමාණයක් නෑ. සභාපතිතුමා මට ලියුමක් දුන්නා. මට මේ මේ ප්‍රමාණයෙන් හදා ගන්න කියලා. ලියුම සාක්කුවේ දාගෙන කථන්දර ටිකක් කියලා තියෙනවා. අපි ඒවාට අනුමැතිය දීලා නෑ මේ මහා සභාවේ. අනුමැතිය දුන්නා නම් දුන්නේ, සානුකම්පිතව. ව්‍යාපාරිකයෙක් විදියට හිටපු මේ නගරයේ යම් කිසි තැනකින් කොටසක් දෙමු කිව්වා. ඊගාව සභාවට එනවා. පළලින් අඩි 14 ½ , දිගින් අඩි 33 ½ ක කොටසක් මැණුම් කරලා මෙයාට දෙන්න. අපි යෝජනාව ඉවත් කලා. එහෙම ඉවත් කරලා තියෙද්දි සභාපතිවරයා හැටියට කොහොමද ලියුම් දෙන්නේ දිසානායක මහත්තයාට ? ඔයා මේක හදා ගන්න කියලා. එයා ඒ ලියුම මහා උජාරුවට පාවිච්චි කරලා , මෙයාලට කියනවලු, මම අධිකරණයට යනවා කියලා. මම කිව්වා , යන්න අධිකරණයට. අපි මානුෂීයව ඒකමතික තින්දුවක් ගත්තා. ඒ කාලේ ඉදලා හිටපු ව්‍යාපාරිකයෙක් හැටියට. ඔයාට යම් කිසි කොටසක් දෙන්න කියන එක. අඩි 10 X 10 කොටසක් හරි. සභාවේ කොහේ හරි. නගරයේ මූණතට තියෙන බුදු මැදුර ගාවින් දුන්නාම අපි නැතත් කවුරු හරි මේ ප්‍රාදේශීය සභාවක ඇවිල්ලා ගොඩනැඟිලි කඩලා මේවා සංවර්ධනය කරද්දි, මේවා අනවසර ඉදි කිරීම් වෙන්නේ නැද්ද? මම අහන්නේ. මේ ලියුම දුන්නා. මම ගරු ලේකම්තුමාගෙන් ඉල්ලනවා. සභාපතිවරයා විදියට ලියුමක් දුන්නා නම්, ඒකේ පිටපතක් ඊගාව සභාවෙදි අපිට ලැබෙන්න සලස්වන්න. එයා මහ උජාරුවට ඒ ලියුම පෙන්න පෙන්න යනවා නම් , ඒ දීපු ලියුමේ පිටපතක් තියෙන්න එපැ සභාවේ. සභාපතිට එහෙම ලියුම් ගහලා එක එක මිනිස්සුන්ට දෙන්න බෑනේ. මේක තනි පුද්ගලයෙක්ගේ බූදලයක් නෙමේනේ. එතකොට කියන්න පුළුවන් මඩ ගහනවා කියලා. මඩ නෙමේ. මේවා දැනගෙන කරන්න. අපි අත යට වැඩ කරලා නෑ එහෙම. සමන් කුලසූරිය මට ලියුමක් දුන්නා. දැන් ඉන්න සභාපති. මන්ත්‍රීවරු දෙන්නේ නෑ. විරුද්ධ වෙනවා. අපිට ඕනි නෑ කාටවත් විරුද්ධ වෙන්න. හැබැයි අපි සභාවේ ගෙනාපු යෝජනාවක් තිබුනා. ඒ සානුකම්පිතව ගෙනාපු යෝජනාව ස්ථිර කලා මිසක් , ස්ථිරව අහවල් ප්‍රමාණ වලට කියලා කිව්වේ නෑ. අපිටත් මේ මිනිස්සු මඩ ගහනවා. උපාලි මන්ත්‍රීතුමා මෙතන හිටියා නම් හොඳයි. කණු ගෙනල්ලා හදන්න යද්දි ඒක වැලකිලා තියෙනවා. ලේකම්තුමා, තොරතුරු දැන ගැනීමේ පනත යටතේ හරි, මොකක් හරි සභාවෙන් දුන්නා නම් දිසානායක කියන පුද්ගලයාට ඊගාව සභාවෙදි ඒක සභාගත කරන්න. අපිත් මේවා දැන ගන්න ඕනි. එයා town එකේදි කියන්න පුළුවන්, සභාවෙන් මෙන්න මෙහෙම දේකට ලියුමක් දීලා තියෙනවා. ඉන්න මන්ත්‍රීවරු දැන් විරුද්ධ වෙනවලු කියලා. අපි දුන්නේ නෑනේ. අපි දුන්නද කාටවත් කඩයක් හදා ගන්න කියලා. අහවල් කොටස කියලා නිර්නායක කලේ නෑ අපි. ඒ වගේ ප්‍රශ්න තියෙනවා. තමන්ගේ පරිසරය අනුව ගනුදෙනු කරලා මේ මඩ වලට වැටෙන්න බෑ මන්ත්‍රීවරුනේ. ඔයා කරුණාකරලා ඔය කතාව නවත්වන්න.අපිට දෝෂාරෝපනය කරන්න එපා.මානුෂීයව තීන්දුවක් ගත්තට,ඉඩම් කොටසක් දෙන්න කියලා තීරණය කලේ නෑ කියලා මම කිවුවා.මේවා කතා කරන් නැතුව ඉන්න බෑ සභාවේ.මන්ත්‍රීවරු විදිහට කතා

කරන්න වෙනවා.අපි ඒවාට විරුද්ධ වෙනවා කියලා පෞද්ගලිකව අපිත් එක්ක වෛර බඳින්න පුළුවන්.අපිට විරුද්ධ වෙන්න ඕනි නෑ.කාටට හරි එදා වේලක් හොයාගන්න තැනක් දෙනව නම් ඒක දෙන්නෙ බොහොම සද්භාවයෙන්.දෙන දෙයක් පූර්වාදර්ශයක් නොවෙන්න දෙන්න නම් ඒක එහෙම කරන්න ඕනි. අද ආපු ඇමුණුම 2,3 ත් ඔය ප්‍රශ්න ටික ආවෙත් ඒකනෙ.අපි දිගින් දිගට කතා කරන්න කාලය ගත්තෙත් ඒකයි.මේවා ඉස්සරහට කතා කරලා නිවැරදි කරන්න කාලයක් නැති වෙන්න පුළුවන්. හැබැයි මේකෙදි අදාල පුද්ගලයා සභාපතිවරයා හැටියට සභාවට ගෙන්නලා හරි ඒ ලියුම ගන්න. ඔබතුමා දිසානායක මහත්තයට ඇත්තටම ලියුමක් දුන්නද?

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

ලියුමක් දුන්නා. ඔබතුමා කතා කරන්නකෝ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

හරි. ඒ වගේ ප්‍රශ්න තියෙනවනේ අසරණ වෙන්න බැනේ. මොනව හරි දෙයක් කරනව නම් අපි ඔක්කොම සද්භාවයෙන් දෙමු.අපිට ප්‍රශ්නයක් නෑ.එහෙම දුන්න නුදුන්න කියලා අපේ වෛරෙකුත් නෑ.මේ සියල්ල දාලා එළියට ගිහාම සාමාන්‍ය මිනිස්සු. කතා බහ කරලා ගනුදෙනු කරලා අපි සුහදව ඉමු.අපි කාටවත් මඩ ගැහුවා කියලා අපිට ගෙනියන්න දෙයක් නෑ.රත්නපාල මහත්තයගෙන් පස්සේ ඔබතුමා පත් වුනා කියලා අපේ විරෝධතා තිබුණා. නමුත් මේක විසුරුවන කාලය දක්වා යනවා.ඒ තුල අපි වැඩ කරමු. වෛරය හැමදාම පවත්වාගෙන යන්න බෑ. අපි සුහදතාවයේ දෑත් දිගු කරද්දී, අපිත් එක්ක අත්වැල් බැඳගෙන යන්නේ නැති නම් ප්‍රාදේශීය සභාවේ මේ ගමන යන්න බෑ. ඊගාව සභාවක් තියන්න පුළුවන් විසුරුවන්නත් පුළුවන්. මැතිවරණය මාර්තු 9 තියෙන්න පුළුවන් නැතිවෙන්න පුළුවන්.ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ විදිහට අපි මන්ත්‍රීවරු ගොඩක් මේකේ හිටියා. පහුගිය කාලවල වුණු සිත්තැවුලුත් එක්ක මම ස්වාධීන මන්ත්‍රීවරයෙක් හැටියට මේ වන විට අත්සන් කරල තියෙනවා. මම මෙතන ඉන්න එක මන්ත්‍රීවරයෙක්වත් එක්ක තරහ නෑ.ශ්‍රී ලංකා පොදු ජන පෙරමුණ නියෝජනය කරන පරණ මන්ත්‍රීවරු 4 දෙනෙයි ඡන්දෙට ඉල්ලන්නේ. අනිත් ඔක්කොම නවක කට්ටිය. මම කිසිම කෙනෙක් එක්ක අබමල් රේණුවකවත් තරහක් නෑ. ප්‍රාදේශීය සභාව විසුරුවලා නැති නිසා මම තවම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණේ පසු පෙල මන්ත්‍රීවරයෙක් ලෙස ඉන්නවා. මම පෞද්ගලිකව කා එක්කවත් තරහා නෑ. පසුගිය වකවානු වල මොනා හරි අතපසු වීම් සිදුවුණා නම් මම පෞද්ගලිකව සමස්ත සභාවෙන්ම සමාව භජනය කරනවා. ස්වාධීන මන්ත්‍රීවරයෙක් ලෙස රුවන්වැල්ල කොට්ඨාසයට මම ඉදිරියේ දී තරග කරනවා. ජනතාව අපට ජන වරමක් දුන්නොත්,මේ ප්‍රාදේශීය සභාවේ උන්නතිය වෙනුවෙන් උපරිම වැඩ කොටසක් කරන්න මම කටයුතු කරනවා. මම නවත්තපු තැනින්. මගේ වැඩ පිළිවෙල මගේ මිනිස්සුම කකුලෙන් ඇදලා නවත්වද්දී, මට ඒ ගමන යන්න බැරි වුණා.ඒ පවුල තුල තිබුණ අසමගිය තුල මම ශ්‍රී ලංකා පොදුජන පෙරමුණෙන් ඡන්දෙ ඉල්ලන්නේ නෑ කියලා තීරණය කලා. කණ්ඩායම් හැඟීමෙන් යන්න බැරි නිසා මම ඉවත් වුණා. මට ආදරය කරන ජනතාව රුවන්වැල්ල කොට්ඨාසය තුල ඉන්නවා. මම ඉවත් වීම තුල මම මහ ජනතාවට කිවුවෙත්, මම පොදු ජන පෙරමුණ ගැන වෛරයක් නෑ. පක්ෂේ ගැන වෛරෙකුත් නෑ.මම ස්වාධීන වුනේ මට පැහැදිලිව වැඩ ටිකක් කරන්න අවශ්‍යතාවයක් තියෙන නිසා. මහ ජනතාව ඊගාව ප්‍රාදේශීය සභාවට සුදුසු පුද්ගලයෝ පත් කරලා එවයි. ඔබ අප සියලු දෙනා පක්ෂ හැටියට ඉදිරියේදී ඡන්දයට තරග කරාවී. අපි කවුරුත් එකිනෙකාට මඩ ගහ ගන්න අවශ්‍යතාවයක් නෑ. අපි කරපු භූමිකාව අපි වපුරපු දේ බීජ හැටියට ගම් වල පැළ වෙලා තියෙනවා නම්, ගම් වල ජනතාව අපිට ඒකට ප්‍රති උපකාර කරයි. මෙතන සිටින නොසිටින සියළුම අපේක්ෂක මහතුන්ට පලාත් පාලන මැතිවරණයේ නියත ජයග්‍රහණයක් කරලා සුදුස්සන් හැටියට පත් වෙන්න වාසනාව ලැබේවායි ප්‍රාර්ථනා කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තූතියි.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

ගරු මන්ත්‍රීතුමා,දිසානායක කියන පුද්ගලයාට අපි මේ සභාවේ යෝජනාවක් ගෙනාවා. තාවකාලික කඩයක් ඉදිකර ගන්න අවස්ථාව දෙන්න, එතුමාට වෙච්ච අසාධාරණය සම්බන්ධව. ඒ යෝජනාව ඒකමතිකව සම්මත කලා. මම තාවකාලික ඉදි කිරීමක් ඒ ස්ථානයේ කර ගන්න කියලා ලියුමක් දුන්නා. නමුත් එතුමා තාවකාලික ඉදි කිරීමක් නෙවෙයි, කොන්ක්‍රීට් දාලා ඉදි කිරීම් කරන්න හදනකොට, සභාපතිවරයා හැටියට මම ඒ ඉදි කිරීම නැවැත්තුවා. ඔය කටයුත්ත තමයි එතන සිද්ධ වෙලා තිබුනේ.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

ඔබ තුමාද ඒක කලේ?

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

ඔව්. මම එතුමට කතා කරලා ඉදි කිරීම නතර කලා. මම ලියුමක් දුන්නා. ගරු ලේකම්තුමනි, ඉදිරි සභා වාරයක් තිබුනත් නැතත් මෙතුමලාට ඒ ලියුමේ පිටපත් පෞද්ගලිකව තැපැල් කරන්න. ඒකේ අවසානේ තාවකාලික ඉදි කිරීමක් කරන්න, සභාවට අවශ්‍ය වන ඕනෑම අවස්ථාවක ඒ ඉදි කිරීම ඉවත් කරන්න සභාවට බලය තියෙනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

ඒ පුද්ගලයා කරන ප්‍රකාශය බරපතලයිනේ.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

මම ඒ පුද්ගලයාට දැනුවත් කිරීමක් කරන්නම්. තාවකාලික ඉදි කිරීම දැනට අත් හිටුවලා තියෙනවා. ඒ ලියුමේ මේ විදිහට කියලා තියෙනවා. තාවකාලික ඉදි කිරීමක් කරගෙන එයාගේ වෙළදාම් කටයුතු කරන්න කියලා. මම කිසිම අවස්ථාවක ඥාති සංග්‍රහයක් කරලා නෑ. මේ සභාවේ මම දන්න විදිහට අවශ්‍ය කටයුතු කලා. නඩු සම්බන්ධවත් මම හොය හොයා කටයුතු කලා. ඒ නිසා තමයි මේවා ඇදිලා ආවේ. නිශ්ශබ්දව හිටියා නම් ඔක්කොම නඩු ටික පරාදයි.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

ඔබතුමා දුන්න ලියුමේ හදා ගන්න දුන්න දිග පළල ප්‍රමාණයක් තියෙනවද?

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

තාවකාලික ඉදි කිරීමක් කරන්න කියලා තියෙනවා. දිග පළලත් තියෙනවා. කාර්මික නිලධාරිතුමිය තමයි ඒකට දිග පළල හදලා දුන්නේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

කාර්මික නිලධාරිතුමියට දිග පළල තීරණය කරන්න බැහැනේ.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

ඒ සභා යෝජනාව දාපුවම මෙතන ප්‍රතික්ෂේප වුණා නේ.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

එහෙමනම් එයා කොහොමද දිගක් පළලක් තීරණය කරන්නේ? එයාට මොකද්ද තියෙන නෛතික බලය සභාවේ තීන්දු කරන්නෙ නැතිව දිගක් පළලක් තීරණය කරන්න?

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

කෙසේ වෙතත් ඒ ඉදි කිරීම නවත්තලා තියෙනවා. ඉදි කිරීම් කටයුතු නවත්තන්න කියලා මම ලියුමක් යවනවා.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

පැහැදිලිව ලියුමේ පිටපතක් අවශ්‍යයි. ඒ මනුස්සයා සභාවෙන් දුන්න ඉඩමේ හදන්නේ කියලා තැන තැන ගිහින් කියනවා. අපිත් මේ ගැන දන්නේ නැනේ.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

ඒ කාර්යය නවත්තන්න කියලා, ඒ ලියුම අවලංගු කරලා ලියුමක් යවන්නම්. මම දීපු ලියුමේ පිටපතකුත් ඔබතුමාට දෙන්නම්.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.ආර් මංජුල නවරත්න මහතා

අපිට ඒ ලියුමේ පිටපතක් දෙන්න. ඔබතුමා නැවත ලියුමක් යවන්න ඉදි කිරීම නවත්තන්න කියලා. අපි මේ දේවල් දැන ගන්න ඕනි මන්ත්‍රීවරු හැටියට.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

අපේ ලේකම්තුමාට කරුණු පැහැදිලි කිරීමක් කරන්න අවශ්‍යයි කියනවා. කාරක සභා අවස්ථාවකට සභාව යොමු කරන්න.

ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය කිරීම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින්, ගරු මහා සභාව කාරක සභාවක් බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

කාරක සභාව , ගරු මහා සභාව බවට පරිවර්තනය කිරිම සුදුසු බවට ගරු සභාපති එච්.සමන් කුලසූරිය මහතා යෝජනා කරන ලද අතර, එය ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එන්.බී.කේ කරුණාරත්න මහතා ස්ථිර කරන ලදින් , කාරක සභාව ගරු මහා සභාව බවට පරිවර්තනය වූ බව ගරු සභාපතිතුමා ප්‍රකාශ කරන ලදි.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

සුභ සාධක සංගමේට මන්ත්‍රීවරුන්ගේ යම් පරිත්‍යාගයක් කරනවා නම්, ඒ මුදල කොපමණද කියලා ඔබතුමාලා තීරණය කරන්න.

ගරු උප සභාපති කේ.පී රත්නපාල පීරිස් මහතා

එක එක්කෙනාට පුළුවන් විදියට දෙන්න කියන්න.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ඩී.ඒ.බී.කේ.කරුණාරත්න

ආරාධනා පත්‍ර දීලා හැමෝටම ආරාධනා කරනවා කිව්වානේ. කැමති කෙනෙක් කැමති විදියට ආධාර කරා නම් හරි.

ගරු සභාපති එච්. සමන් කුලසූරිය මහතා

ඒ කටයුත්ත ඒ විදියට කරා නම් හරි නේද? ආරාධනා කරනවනේ අපිට. ඒ අවස්ථාවට සහභාගි වෙලා තමන් කැමති මුදලක් දුන්නහැකි. තව අදහස් දක්වන්න කවුරුවත් ඉන්නවද? නෑ නේද? අද දින මහා සභාවට පැමිණි සියළු දෙනාට ස්තුතිය පුද කරමින් මහා සභාවේ කටයුතු අවසන් කරනවා.

මෙදින ගරු මහා සභාවේ කටයුතු ප.ව 01.00 පමණ වන විට අවසන් විය.

පී.ජී.යූ ජයවික්‍රම,

ලේකම්,

ප්‍රාදේශීය සභාව,

රුවන්වැල්ල.